# වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT

# 2024

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
ஏற்றுமதி விவசாயத் திணைக்களம்
**DEPARTMENT OF EXPORT AGRICULTURE**

+ 94 812 388651 direxag@sltnet.lk www.dea.gov.lk

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
விவசாய, கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation

# 2024

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT


**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
ஏற்றுமதி விவசாயத் திணைக்களம்
**DEPARTMENT OF EXPORT AGRICULTURE**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
விவசாய, கால்நடை வளங்கள், காணி மற்றும் நீரப்பாசன அமைச்சு
**Ministry of Agriculture, Livestock, Lands and Irrigation**

| පටුන | පිටුව |
|---|---|


01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 05
1.1. හැඳින්වීම 05-06
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 07
1.3. ප්‍රධාන කාර්යයන් 08
1.4. සංවිධාන සටහන 09
1.5. දෙපාර්තමේන්තුවේප්‍රධාන අංශ හා ආයතන 10
1.5.1. දෙපාර්තමේන්තුවේප්‍රධාන අංශ 10
1.5.2. දිස්ත්‍රික් කාර්යාල 10

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 11
2.1. විශේෂ ජයග්‍රහණ හා අත්පත් කර ගැනීම් 11-21
2.2. අභියෝග හා ඉදිරි ඉලක්ක 21-22
2.2.1. අභියෝග 21-22
2.2.2. අනාගත ඉලක්ක / අරමුණු 22-24

03. පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය 25
3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 25
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 26
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 27
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 28
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 28
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 28
3.7. මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 29
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 29
3.9. විගණකාධිපති වාර්තාව 30-41

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 43
4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 43
4.1.1. අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන 43-48
4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම්,අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හායටිතල පහසුකම් 48-49

| | | |
|---|---|---|
| 05. | පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේකාර්ය සාධනය | 51 |
| | 5.1. දෙපාර්තමේන්තුවට අදාළව හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු | 51-52 |
| | 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 52-53 |
| 06. | පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ | 55 |
| | 6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය | 55 |
| | 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය | 55 |
| | 6.3. මානව සම්පත් සංවර්ධනය | 55-58 |
| 07. | පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව | 59-64 |
| | ඇමුණුම 01 - අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව | 65 |

# පරිච්ඡේදය 01

# ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරාතන සමයේ සිට කුළුබඩු සඳහා කීර්ති නාමයක් දිනා සිටිය ද ජාතික මට්ටමෙන් මෙම කර්මාන්තය සඳහා අවධානය යොමු කෙරුණේ 1971 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මඟින්ය. ඉන් පසුව 1972 දී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් තුළින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධිතව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. 1975 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම  අමාත්‍යාංශය යටතට ගෙන එන ලදි. ලෝක ආහාර වැඩසටහන (WFP) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් මූලාරම්භ කරන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහනේ කාර්යයන්වල කොටසක් දෙපාර්තමේන්තුවට පැවරීමත් සමඟ දෙපාර්තමේන්තුවේ එවකට කාර්යභාර්ය බවට පත්ව තිබූ මායිම් ඉඩම්වල කුළුබඩු වගා කිරීම වෙනුවට අපනයන  කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කුළුබඩු ආශ්‍රිත බෝග සංවර්ධනය මත පදනම් වූ අපනයන සංවර්ධනයේ නියමුවා විය.

1992 අංක 46 දරණ පාර්ලිමේන්තු පනතින් මෙම දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යනුවෙන් නැවත නම් කරන ලදි. එමඟින් කුළුබඩු සහ වෙනත් කෘෂිකාර්මික  බෝග අපනයනයට අදාළව නෛතික අධිකාරි බලය දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි.  එතැන් සිට මෙම දෙපාර්තමේන්තුව ක්ෂේත්‍ර, පර්යේෂණ මෙන්ම සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙය වීම් කටයුතු සිදු කරන ලදි. ඒ අනුව කුළුබඩු ක්ෂේත්‍රයේ ප්‍රවීණයා වෙමින් එහි සංවර්ධනය සහ ව්‍යාප්තිය පිළිබඳ දීප ව්‍යාප්ත ජාලයක් මඟින් දෙපාර්තමේන්තුව මෙම අංශයේ අදාල පාර්ශවකරුවන්ට පහසුකම් සපයයි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් වශයෙන් ගම්මිරිස්, කරාබු, සාදික්කා, කරඳමුංගු, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, වැනිලා, පැඟිරි, සේර, ගොරකා, ඉඟුරු හා කහ ආදී කුළුබඩු බෝග, පානීය භෝග සහ උත්තේජක භෝග අපනයනය ප්‍රවර්ධනය කිරීම හඳුනාගෙන තිබේ. ඒ සඳහා අපනයන කෘෂි බෝග වගා වපසරිය වැඩි කිරීම, පවත්නා වගාවල ඵලදායීතා කටයුතු, පසු අස්වනු තාක්ෂණ ප්‍රවර්ධන වැනි සංවර්ධන කටයුතු හා නව ප්‍රභේද  හඳුන්වා දීම, නව තාක්ෂණික දැනුම සහ නවෝත්පාදන අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයට හඳුන්වා දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව 2024 වසරේ දෙපාර්තමේන්තුව සඳහා  සෘජුව අයවැය මඟින් වෙන් වූ රුපියල් මිලියන 517 ක ප්‍රතිපාදන මඟින් දෙපාර්තමේන්තු සමස්ත ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන් ක්‍රියාවට  නංවන ලදී.

නිෂ්පාදන පරිමාව ඉහළ දමමින් අපනයන ආදායම ඉහළ නැංවීමේ දෙපාර්තමේන්තු ප්‍රධාන ඉලක්කය සපුරා ගැනීමේ දී වගා වපසරිය වාර්ෂිකව ඉහළ නැංවීම සඳහා යොමු කළ අවධානයට සාපේක්ෂව අපනයන භෝග වල අගය එකතු කිරීමේ නිෂ්පාදන සහ ගුණාත්මක නිෂ්පාදන ඉහළ නැංවීම තුළින් ඉහළ වෙළඳපල වාසි ලබා ගැනීම පිළිබඳවද විශේෂ අවධානයක් 2024 වසර තුල දී යොමු කරන ලදි.

දේශගුණික, කාලගුණික වෙනස්කම් හා වෙළඳපල මිලෙහි බලපෑම මත වුව ද අපනයන ආදායම 2024 වන විට රුපියල් මිලියන 157,199.30 ක් උපයා ගැනීමට හැකිවිය.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදනයෙන් විශිෂ්ටත්වය

### මෙහෙවර

වැඩි විදේශ විනිමයක් ඉපයීමත් අපනයන කෘෂිබෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජයීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍යවන්නා වූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

### අරමුණු

අපනයන පරිමාව වැඩිකිරීම හා නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය උසස් කිරීම තුළින් ඉහළ විදේශ විනිමය ඉපයීමක් සඳහා අපනයන කෘෂිබෝග අංශය සංවර්ධනය කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය.
- බෝග සංවර්ධනය, බෝග වගාව, බෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ, ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින් යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීම.
- බෝග නිෂ්පාදනය, ඵලදායිතා වර්ධනය හා ගුණාත්මකභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය.
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමනාකරණය ප්‍රවර්ධනය.
- කාබනික වගාව ප්‍රවර්ධනය.
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම.
- අපනයන කෘෂි බෝග නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයින් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම.
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම.
- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම.
- තාක්ෂණික ආදර්ශණ පවත්වාගෙන යාම.

## 1.4. සංවිධාන සටහන

**සංවිධාන සැලැස්ම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**




**නි.අ.**- නියෝජ්‍ය අධ්‍යක්ෂ, **ස.අ.**- සහකාර අධ්‍යක්ෂ, **ව්‍යා.උ.ඒ.**- ව්‍යාපාර උපදේශන ඒකකය, **ම.ප.ම.**- මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, **පැ.සං** - පැලෑටි සංරක්ෂණය, **උ.ප.ම.**- උප පර්යේෂණ මධ්‍යස්ථානය, **ආ.ප.ඒ.**- ආර්ථික පර්යේෂණ ඒකකය, **සං.ලේ.**- සංඛ්‍යාලේඛනඥ, **ප්‍ර.අ.විගණක** - ප්‍රධාන අභ්‍යන්තර විගණක, **පරි.නි.**- පරිපාලන නිලධාරී, **පරි.නි.(මෙ.)**- පරිපාලන නිලධාරී (මෙහෙයුම්), **භාෂා පරි.**- භාෂා පරිවර්තක, **පර්.සං.ස.**- පර්යේෂණ හා සංවර්ධන සහකාර, **සං.ස.**- සංවර්ධන සහකාර, **අය.සහ.**- අයවැය සහකාර, **සං.නි.** - සංවර්ධන නිලධාරී, **ප්‍ර.තා.නි.**- ප්‍රධාන තාක්ෂණ නිලධාරී, **තො.හා සං.තා.නි.**- තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී, **කළ.ස.**- කළමනාකරණ සහකාර, **පුස්ක.**- පුස්තකාලාධිපති, **දි.ව්‍යා.නි.**- දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරී, **ව්‍යා.නි.**- ව්‍යාප්ති නිලධාරී, **තා.නි.**- තාක්ෂණ නිලධාරී, **කා.නි.**- කාර්මික නිලධාරී, **සං.තා.සහ.**- සන්නිවේදන තාක්ෂණ සහකාර, **ගො.ක.** - ගොවිපළ කළමනාකරු, **ගො.සේ.ස.**- ගොවිපළ සේවා සහකාර, **නි.පා.** - නිවාස පාලක.

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ආයතන

### 1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. සංවර්ධන අංශය
2. පර්යේෂණ අංශය
3. පාලන අංශය
4. ගිණුම් අංශය

### 1.5.2. දිස්ත්‍රික් කාර්යාල 17 ක් පහත අයුරින් ව්‍යාප්තව ඇත.

| | | |
|---|---|---|
| මධ්‍යම පළාත | - | මහනුවර, මාතලේ, නුවරඑළිය |
| සබරගමුව පළාත | - | කෑගල්ල, රත්නපුර |
| ඌව පළාත | - | බදුල්ල, මොණරාගල |
| දකුණු පළාත | - | ගාල්ල, මාතර, හම්බන්තොට |
| බස්නාහිර පළාත | - | කොළඹ, කළුතර, ගම්පහ |
| වයඹ පළාත | - | කුරුණෑගල (පුත්තලම දිස්ත්‍රික්කය ද ආවරණය වේ.) |
| නැගෙනහිර පළාත | - | අම්පාර (මඩකලපුව දිස්ත්‍රික්කය ද ආවරණය වේ.) |
| උතුරු මැද පළාත | - | අනුරාධපුර, පොළොන්නරුව |

පර්යේෂණ මධ්‍යස්ථාන හා උප පර්යේෂණ මධ්‍යස්ථාන වල පිහිටීම

1. මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, මාතලේ
2. අතුරුවගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය, දම්පැලැස්ස, නාරම්මල
3. ආර්ථික සහ අලෙවිකරණ පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය
4. මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය, දැල්පිටිය, ගම්පොල
5. පටක රෝපණ පර්යේෂණ මධ්‍යස්ථානය හා පැළ තවාන, වල්පිට, ගම්පහ
6. උප පර්යේෂණ මධ්‍යස්ථානය, කුණ්ඩසාලේ
7. උප පර්යේෂණ මධ්‍යස්ථානය, නිල්ලඹ, ගලහ

දෙපාර්තමේන්තු මධ්‍යම පැළ තවාන් වල පිහිටීම

| | | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | - | සෙරපීස් පැළ තවාන - පොල්ගහවෙල<br>හොලොන්ගොල්ල පැළ තවාන - දොඩන්ගස්ලන්ද<br>වෙන්නෝරුව පැළ තවාන - නාරම්මල |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | - | බ්ලැක්වෝටර් පැළ තවාන - ගිනිගත්හේන<br>මුල්හාල්කැලේ පැළ තවාන - වලපනේ |
| මාතලේ දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - ඇල්වල, උකුවෙල |
| මාතර දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - මාපළාන, කඹුරුපිටිය |
| කෑගල්ල දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - ගස්නාව, නෙලුන්දෙනිය |
| ගම්පහ දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - වල්පිට, දිවුලපිටිය |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන හා කුළුබඩු උද්‍යානය - මිද්දෙණිය |

# පරිච්ඡේදය 02
# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 විශේෂ ජයග්‍රහණ හා අත්පත් කරගැනීම්

- මහා භාණ්ඩාගාරය මඟින් 2024 වසරේදී අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ලබා දුන් රු.මි. 400.00 ක ප්‍රතිපාදන වලින් වගා ව්‍යාප්ති වැඩසටහන, මධ්‍යම පැළ තවාන් සංවර්ධනය, ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන, අගය එකතු කිරීමේ වැඩසටහන, සන්නිවේදන වැඩසටහන් හා ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා රු.මි. 368.0723 ක් වැය වූ අතර එය ලබා දුන් සමස්ත මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 92% ක් විය.

- විශේෂ ව්‍යාපෘතියක් ලෙස අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ ලබා දුන් මුළු ප්‍රතිපාදන රු. මි. 35.00 ක ප්‍රතිපාදන මඟින් ඇලුමිනියම් ඉනිමඟවල්ද, ගම්මිරිස් වියලනයන්, තණකොළ කපන යන්ත්‍ර, ගම්මිරිස් බීජ වෙන් කරන යන්ත්‍ර, වල් නෙලීමේ යන්ත්‍ර, සුදු යකඩ බේසම්, සුදු යකඩ මේස, තෙතමන විශ්ලේෂක වැනි පසු අස්වනු තාක්ෂණ උපකරණ ලබා දුන් අතර මේ සඳහා රු. මි. 6.5 ක් වැය විය.

- 2024 ජූලි 31 වන දින තෙක් කුරුඳු බෝගය සඳහා ප්‍රතිලාභීන් විසින් දැරිය යුතු මුදල් ගෙවීමෙන් අනතුරුව කුරුඳු පැළ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සඳහා ලබා දෙන ලදී.

- 2024 වසරේ ක්‍රියාත්මක කරන ලද අපනයන බෝග සංවර්ධන වැඩසටහනේ වගාවපසරිය ඉහළ නැංවීම යටතේ ක්‍රියාත්මක කරන ලද නව වගා වැඩසටහන, කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන, අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන හා පුවක් වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, සමස්ත වැඩසටහන සඳහා රු.මි. 192.82 ක් වූ මූල්‍ය ඉලක්කයෙන් රු.මි. 178.52 ක් වැය විය.

  නව වගා වැඩසටහන යටතේ ඉලක්කගත වගා වපසරිය වූ හෙක්ටයාර 1731 න් හෙක්ටයාර 1321.59 ක භූමි වපසරියක නව වගාවන් ආරම්භ කරන ලද අතර එය ඉලක්කගත වගා වපසරියෙන් 76.35 % ක් විය.

  ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය කුළුබඩු ගෙවත්ත තුළින්ම නිෂ්පාදනය කරගැනීම, ගෙවත්ත තුළ කුඩා පරිමාණ ආර්ථික වගාවන් ඇතිකිරීම, අපනයන කෘෂිබෝග පොකුරු ගම්මාන ලෙස වගාකිරීම, ඉඩමේ ඵලදායිතාවය වැඩිකිරීම සහ අපනයන කෘෂිබෝග ප්‍රවර්ධනය අරමුණු කරගෙන කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් ආර්ථික ඵලදායිතාවයෙන් යුතු අපනයන කෘෂි බෝග ආදර්ශ ගෙවතු ස්ථාපිත කිරීම සඳහා ගම්මිරිස්, වැනිලා, කෝපි, බුලත්, කරාබු, කොකෝවා, ගොරකා, සාදික්කා සහ කහ වගාවන් සඳහා අපනයන කෘෂි බෝග රෝපණ ද්‍රව්‍ය ලබා දීම සිදු කරන ලදී. මෙම වැඩසටහන සඳහා මුළු

අපනයන කෘෂි බෝග පැළ 1,121,666 ක් ලබා දීමට ඉලක්කගත වූ අතර, එම රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණයෙන් 899,775 ක් ගොවීන් අතර ලබා දීමට හැකිවූ අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් 79.33% ක් විය.

අපනයනය සඳහා පුවක් නිෂ්පාදනය වැඩි කිරීම, වගාකරුවන්ගේ ආදායම වැඩි කිරීම සහ පාංශු හා ජල සංරක්ෂණය වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් පුවක් වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.මෙම වැඩසටහන යටතේ තනි වගාවක්, අතුරු වගාවන්, මිශ්‍ර වගාවන්, ගෙවතු, වාරිමාර්ග දෙපස, ජල පෝෂක ප්‍රදේශ, පරිසර සංරක්ෂණ කටයුතු සිදු කරන ස්ථාන, රාජ්‍ය වතු, සමාගම් වතු, හා පුද්ගලික ආයතන සතු ඉඩම්වල සිටුවීම සඳහා පුවක් පැළ නිකුත් කරන ලදී. ඒ අනුව, මේ යටතේ 2024 වසරේදී පුවක් පැළ 1,662, 200 ක ඉලක්ක ගත පැළ ප්‍රමාණයෙන් පුවක් පැළ 1,532,525 ක ප්‍රමාණයක් ලබා දෙන ලද අතර එය සමස්ත ඉලක්කයෙන් 92.19% ක් විය.

- උසස්, ගුණාත්මක අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීම වැදගත් වන අතර, 2024 වසර තුළ ගොවීන් වෙත උසස් ගුණාත්මයෙන් යුතු සහතික කරන ලද පැළ අවශ්‍යතාවය දෙපාර්තමේන්තු පැළ තවාන් 12 ක් හා පෞද්ගලික පැළ තවාන් 661 ක් මඟින් සපුරා ගන්නා ලදී. 2024 වසරේදී ගස්නාව පැළ තවානේ ජල සම්පාදන පද්ධතිය පිහිටුවීම අවසන් කරන ලද අතර මිද්දෙණිය පැළ තවාන සඳහා අවශ්‍ය පැළ මඩුවක් සකස් කරන ලදී. තවද, ගොවිපලවල් සඳහා අවශ්‍ය ගොවිපල උපකරණ 161 ක් මිලට ගනු ලැබූ අතර, පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පුවක්, සාදික්කා, කෝපි බීජ මිලදී ගන්නා ලදී. මේ යටතේ පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොලිතීන් බෑග් 900,000 ක් හා බඳුන් මාධ්‍ය කියුබ් 275 ක් මිලදී ගන්නා ලදී. මධ්‍යම පැළ තවාන් සංවර්ධනය සඳහා 2024 වසරේදී රු.මි. 12.50 ක මූල්‍ය ඉලක්කයෙන් රු.මි. 8.168 ක් වැය වූ අතර එය සමස්ත ප්‍රගතියෙන් 65 % කි.

- 2024 වසරේදී ද අපනයන කෘෂි බෝග ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ යහපත් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම තුළින් පවත්නා වගාවන්හි ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා පාළු පැළ ලබා දීම, අපනයන බෝග වලට හානි කරන පලිබෝධ හා සත්ත්ව හානි වළක්වා ගැනීමේ අරමුණින් උපාංග හා පද්ධති ගොවීන් වෙත ලබා දෙන ලදි. සමස්ත වැඩසටහන සඳහා 2024 වසරේදී රු.මි. 47.72 ක් වෙන් කරන ලද අතර ඉන් රු.මි. 16.436 ක් වැය වූ අතර එය සමස්ත ප්‍රගතියෙන් 34.4% ක් විය.

පාළු පැල සිටුවීම යටතේ ඉලක්කගත වගා වපසරිය වූ හෙක්ටයාර 6,082 කින් හෙක්ටයාර 4,105.91 ක් සඳහා ගම්මිරිස්, කොකෝවා, කරාබු, කෝපි, සාදික්කා යන අපනයන කෘෂි බෝග පැළ ලබා දෙන ලදි. පළිබෝධ හා සත්ත්ව හානි වළක්වා ගැනීමේ අරමුණින් යුතුව ක්‍රියාත්මක කරන ලද පළිබෝධ පාලන ඒකක ලබා දීමේ වැඩසටහන යටතේ ඉලක්කගත ඒකක 32 න් ඒකක 13 ක් ලබා දීමට හැකි විය. බිංදු හා විසිරි ජල සම්පාදන පද්ධති ඒකක 35 ක ඉලක්ක ගත වූ ප්‍රමාණයෙන් ඒකක 18 ක් ස්ථාපනය සඳහා වැය වන පිරිවැයෙන් 50% ආයෝජන ආධාර ක්‍රමය යටතේ ලබා දෙන ලදි. ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ ගම්මිරිස්

ක්ෂණික මැලවීමේ රෝග හා සාදික්කා පත්‍ර පතන රෝග මර්දනය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කරන ලදී.

- බෝග අගයදාම සංවර්ධන වැඩසටහන යටතේ අපනයන කෘෂි බෝග සඳහා වූ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහතිකකරණ වැඩසටහන, අගයදාම සංවර්ධනය, වෙළඳ ප්‍රවර්ධනය, තත්ත්ව සහතිකකරණ, පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම සමස්ත වැඩසටහන සඳහා රු. මි. 43.80 ක මූල්‍ය ඉලක්කයක් වෙන් කරන ලද අතර ඉන් 2024 වසරේදී රු.මි. 42.156 ක් වැය විය. එය සමස්ත ප්‍රගතියෙන් 96.2% කි. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහතිකකරණ වැඩසටහන යටතේ සහතික ලබාගැනීමට ඉදිරිපත් කර තිබූ අයදුම්පත්වලින් GAP සහතික 03 ක් ලබා දීමට හැකි වූ අතර ඒ යටතේ වැඩසටහන් 03 ක් පවත්වා ඇත.

- අපනයන කෘෂිබෝග නිෂ්පාදන වල පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම තුළින් නිෂ්පාදන ගුණාත්මය ඉහළ නැංවීම, අගය වැඩි කල නිෂ්පාදන සඳහා දිරිමත් කිරීම සහ ආයෝජන ආධාර ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අපේක්ෂාවෙන් පසු අස්වනු තාක්ෂණ වැඩසටහන 2024 වසර තුළ දී ද ක්‍රියාවට නංවන ලදී. පසු අස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය යටතේ 2024 වසරේදී පසු අස්වනු තාක්ෂණ උපකරණ 144 ක් සඳහා ආධාර ලබාදෙන ලද අතර පසු අස්වනු තාක්ෂණ සැකසුම් මධ්‍යස්ථාන 02 ක් ස්ථාපනය සඳහා ආයෝජන ආධාර ලබා දෙන ලදී.

- 2024 වසරේදී ක්‍රියාත්මක කරන ලද අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ගුණාත්මය සහතික කිරීම පිණිස ආරම්භ කරන ලද තත්ත්ව සහතික ලබාදීමේ වැඩසටහන යටතේ සහතික දෙකක් , හා දැනුවත් කිරිමේ වැඩසටහන් 02 ක් පවත්වා ඇත. පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ 745 දෙනෙකු ලියාපදිංචි කරන ලදී.

- සන්නිවේදන වැඩසටහන් අඛණ්ඩව 2024 වසර තුළ ද ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා රු.මි. 20.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඇස්තමේන්තු කරන ලද අතර එම සන්නිවේදන වැඩසටහන් සඳහා රු.මි. 20.51 ක් වැය විය. ඒ යටතේ ගුවන් විදුලි, රූපවාහිනී වැඩසටහන්, මුද්‍රිත මාධ්‍ය, තොරතුරු කේන්ද්‍රය, 1920 කෘෂි සේවා තොරතුරු, වෙබ් අඩවි, facebook, You Tube, Telegram සහ Whatsapp වැනි සමාජ මාධ්‍ය ජාලා මඟින් ද අපනයන කෘෂි බෝග තොරතුරු පාර්ශවකරුවන් අතර සන්නිවේදනය කරන ලදී. රූපවාහිනී වැඩසටහන් ලෙස සැඟවුණු කහවණු වැඩසටහන් 24, රන්මසු උයන වැඩසටහන් 27 ක් විකාශනය කරන ලද අතර, රස ජනනී වැඩසටහන් 52, රස මංසල වැඩසටහන් 43, හරිත මංසල වැඩසටහන් 16 ක් ඇතුළු ගුවන් විදුලි වැඩසටහන් ප්‍රචාරය කරන ලදී. අපනයන කෘෂි බෝග වෙළඳපොළ මිල ගණන් පාර්ශවකරුවන් වෙතට ලබා දීම සඳහා දිනමිණ පුවත්පතේ මිල ගණන් තොරතුරු දැන්වීම් 45 ක් පළ කරන ලදී. අපනයන කෘෂිකාර්මික තාක්ෂණික කරුණු ඇතුලත් අපනයන කෘෂි බෝග

අත් පත්‍රිකා 500 ක් මුද්‍රණය කරන ලද අතර, අපනයන කෘෂි බෝග සම්බන්ධව ප්‍රචාරණ කටයුතු සඳහා බැනර් 22 ක්, අනෙකුත් මුද්‍රණ 175 ක් සිදු කරන ලදී.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති තොරතුරු කේන්ද්‍රය මඟින් අපනයන කෘෂි බෝග පිළිබඳ තොරතුරු පුද්ගල පැමිණීම් 541 ක් වෙත ලබා දෙන ලද අතර දුරකථන මාර්ගය ඔස්සේ 1,178 ක් වෙත තොරතුරු ලබා දී ඇත. 1920 කෘෂි උපදේශන සේවාව යටතේ 1402 ක් වෙත අපනයන කෘෂිබෝග පිළිබඳ තාක්ෂණික තොරතුරු අවශ්‍ය පාර්ශ්වකරුවන් 1402 ක් වෙත ලබා දී ඇත. අපනයන කෘෂි බෝග පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ලබා ගෙන ඇති අතර පුද්ගලයින් 550,616 ක් වෙබ් අඩවිය පරිශීලනය කරමින් අපනයන බෝග පිළිබඳ තොරතුරු ලබා ගෙන ඇත. තවද, facebook හරහා අපනයන බෝග පිළිබඳ තොරතුරු 1,525ක්ද, සජීවි වැඩසටහන් 21 ක්ද අපනයන බෝග තොරතුරු පිළිබඳ ප්‍රතිචාර 1696ක් වෙත ලබා දී ඇත. You Tube Channel හරහා අපනයන කෘෂි බෝග තාක්ෂණික තොරතුරු ඇතුළත් විඩියෝ 109ක්, සජීවි වැඩසටහන් 27 ක්, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම් 129 ක් සිදු කරන ලදී. Telegram හා whatsapp මාර්ගයන් යටතේ පිළිවෙලින් 911 ක් හා 12,512 ක් වෙත අපනයන කෘෂි බෝග තාක්ෂණික හා ගැටළු පිළිබඳ ප්‍රතිචාර දැක්වීම් සිදු කර ඇත.

අපනයන කෘෂි බෝග පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශනාත්මක වැඩසටහන් 08 ක් 2024 වසර තුළ පවත්වා අපනයන කෘෂි බෝග තාක්ෂණික දැනුම පාර්ශවකරුවන් වෙත ලබා දෙන ලදි. ධාරිතා වර්ධන වැඩසටහන යටතේ ගොවි පුහුණු, ක්ෂේත්‍ර දින, මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන්, කුරුඳු පුහුණු වැඩසටහන් හා මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

- 2024 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ධාරිතා වර්ධන වැඩසටහන යටතේ රු.මි. 8.00 ක් වෙන් කරන ලද අතර, ඉන් රු.මි. 4.88 ක් වැය වූ අතර එය සමස්ත මූල්‍ය ප්‍රගතියෙන් 61% ක් විය. මේ යටතේ අපනයන කෘෂි බෝග පිළිබඳ ගොවි පුහුණු වැඩසටහන් 1730 ක් දිස්ත්‍රික්ක 17 තුළ පවත්වා ඇත. ක්ෂේත්‍ර දින වැඩසටහන් 234 ක් ප්‍රතිලාභීන් 56,161 ක් සඳහා පවත්වනු ලැබීය. මෙමඟින් අපනයන කෘෂි බෝග පිළිබඳ තාක්ෂණික දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම ලබා දෙන ලදී.

අපනයන කෘෂිකර්ම සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය මඟින් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් හා නිලධාරීන් දැනුමෙන්, ආකල්පයෙන් හා කුසලතාවයෙන් පිරිපුන් පුද්ගලයින් බවට පත් කරලීම සඳහා 2024 වසර තුල පුහුණු වැඩමුළු හා පුහුණු වැඩසටහන් මෙන්ම මාර්ගගත ක්‍රමය ඔස්සේ ද පුහුණු වැඩසටහන් රාශියක් සාර්ථකව සම්පූර්ණ කරන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු වැඩසටහන් අදාළ අවශ්‍යතාවය පරිදි සිදු කරන ලදී.

කුණ්ඩසාලේ හා කරපිංච ආදී කෘෂිකර්ම විද්‍යාල, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, ඇක්වයිනාස් ආයතනය, කාර්මික විද්‍යාල ආදිය 2024 වසරේ දී විශේෂිත ප්‍රායෝගික පුහුණු සැසි හා වැඩසටහන් මාතලේ සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය තුළ පවත්වන ලදී.

එමෙන්ම මෙම ආයතනය මගින් ඉහළ ප්‍රතිචාර යටතේ මාර්ගගත පුහුණු වැඩසටහන් මාලා 02ක් වඩාත් විධිමත් ලෙස zoom තාක්ෂණය ඔස්සේ පවත්වමින් සජීවීව දෙපාර්තමේන්තු නිල මුහුණු පොත හා යූ ටියුබ් නාලිකා හරහා විකාශනය කරන ලදී. මෙහිදී අඟහරුවාදා දිනයේදි අපනයන කෘෂි බෝග වගාව, නඩත්තුව හා රෝග පාලනයට අදාළ තාක්ෂණික කරුණු ඇතුලත් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- 2024 වසරේදී කුරුඳු පැළ 3, 516,725 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.මි. 63.16 ක් වෙන් කරන ලද අතර, ඒ යටතේ රු.මි. 85.2731ක් වැය කර ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය 135% ක් විය. හෙක්ටයාර 385 ක් කුරුඳු පැළ බෙදා දීම සඳහා ඉලක්කගත කළ අතර හෙක්ටයාර 458.53 ක් සඳහා කුරුඳු පැළ බෙදා දෙනු ලැබූ අතර එහි භෞතික ප්‍රගතිය 119% ක් විය.

  ලෝකයේ ගම්මිරිස් නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් එක්වී 1972 වසරේදී ආසියා සහ පැසිපික් කලාපයන්හි එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම යටතේ ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව නමින් සංවිධානයක් පිහිටුවා ගෙන ඇත. මෙහි ප්‍රධාන හා ස්ථිර සාමාජික රටවල් වනුයේ ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, ශ්‍රී ලංකාව හා වියට්නාමයයි. ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාවේ සභාපතිත්වය වසරක් පාසා ස්ථිර සාමාජික රටවල් අතුරින් එක් රටකට හිමිවන අතර වසරේ සෑම වැදගත් ක්‍රියාකාරකමක්ම එම සභාපතිවරයාගේ ක්‍රියාකාරීත්වයෙන් සිදු කරයි. ඒ අනුව 2024 වසරේ සභාපතිත්වය ශ්‍රී ලංකාවට හිමි වූ අතර, අන්තර්ජාතික ගම්මිරිස් සමුළුව 2024 නොවැම්බර් මස 18 වන දින සිට 21 වන දින දක්වා කොළඹ හිල්ටන් හෝටලයේදි පැවැත්වීමට කටයුතු කරන ලදි. අන්තර්ජාතික සමුළුවට සමගාමීව ප්‍රදර්ශනයක් හා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලද අතර, මේ සඳහා දෙස් විදෙස් පාර්ශ්වකරුවන් 150 ක් පමණ සහභාගී විය. මෙහිදි ගම්මිරිස් නිෂ්පාදනය හා සම්බන්ධ තාක්ෂණික හා ආර්ථික පර්යේෂණ ප්‍රතිඵල සාමාජික රටවල් අතර හුවමාරු කර ගන්නා ලදී.

  අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නකල්ස් කඳු වැටිය ආශ්‍රිතව දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම අරමුණු කරගත් Global Climatic Fund (GCF) විසින් අරමුදල් සපයනු ලැබූ, දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා තිරසාර ඉඩම් කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම, විනාශ වූ භූ දර්ශනය යථා තත්ත්වයට පත් කිරීම සහ ජල සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම අරමුණු කර ගත් GCF නකල්ස් ව්‍යාපෘතිය 2024 වසරේදි මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිය මඟින්, යැපුම් කෘෂිකාර්මික හා වතු ප්‍රජාවන්ගේ ජීවනෝපායන් සහ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම, නියඟය සහ ජලාශ වල ධාරිතාවය ඉහළනැංවීම සහ රොන්මඩ තැන්පත්වීම වැළැක්වීමට ඉහළ ජල පෝෂක ප්‍රදේශවල හා වන ගහනය ශක්තිමත් කිරීම සහ භූමි හායනය

අවම කිරීම, ප්‍රදේශ පාදක කරගත් සංචාරක, කෘෂිකාර්මික සහ සේවාවන්ට නව්‍ය යහපත් කළමනාකරණ ක්‍රමවේද සහ තාක්ෂණික ප්‍රවේශයන් සකස් කිරීම, නව්‍ය පරිසර හිතකාමී රැකියා, මූල්‍ය හා තොරතුරු තාක්ෂණය සඳහා තරුණ සහ ප්‍රජාව සවිබල ගැන්වීම හා දේශගුණික අනුගතවීම පහසු කිරීම සඳහා ගෝලීය සහ සාම්ප්‍රදායික දැනුමින් සන්නද්ධ කිරීමට බහු විධ තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම අපේක්ෂා කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ නව වගා වැඩසටහන, ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන, ගෙවතු වගා වැඩසටහන් සිදු කරන ලද අතර ඒ සඳහා රු.මි. 12.00 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර මෙම වැඩසටහන සඳහා රු.මි. 12.199 ක් වැය කරන ලද අතර එහි සමස්ත මූල්‍ය ප්‍රගතිය 100.9% ක් විය.

දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය ඵලදායිතා සහ තත්ත්ව වැඩි දියුණු කිරීමේ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දායක වී ඇත. ඒ අනුව පාරිසරික, සමාජ, ආර්ථික,සහ දේශගුණික විපර්යාසවල බලපෑම් සලකා බලමින් කෘෂි බෝග නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීමට, ජානමය ද්‍රව්‍ය සංරක්ෂණය කරමින් බෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන් , අපනයන කෘෂි බෝග සඳහා නව රෝපණ ද්‍රව්‍ය, නව වගා කළමනාකරන ක්‍රම, සහ ස්වභාවික සම්පත් කළමණාකරණ උපාය මාර්ග, භෝග ආරක්ෂණ ක්‍රම සහ පසු අස්වනු තාක්ෂණයන් සඳහා පර්යේෂණ අංශය සිදු කළ විවිධ පර්යේෂණ අතරින් 2024 වර්ෂයේදී හඳුනාගෙන ඇති පර්යේෂණ හඳුනාගැනීම් කිහිපයක් පහත දක්වා ඇත.

- දේශීය ගම්මිරිස් වල ස්ථානීය ඇගයීම සඳහා අස්වැන්නේ විභවය, අනුකූලතාව, අතුවල දිග, කරල් ඝනත්වය සහ බෙරි ප්‍රමාණය වැනි ශාකයේ ලක්ෂණ ආදිය සැලකිල්ලට ගනිමින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සමඟ සහයෝගයෙන් විශේෂිත මව් ශාක තෝරා ගැනීම ඉතා සූක්ෂම ලෙස සිදු කර තෝරා ගත් අපනයන කෘෂිබෝග පර්යේෂණ මධ්‍යස්ථානයෙහි පාලිත තවාන් තත්ත්වයන්  යටතේ ප්‍රචාරණය කර නඩත්තු කර ඇත.

- පඳුරු ගම්මිරිස් වගාව සඳහා හඳුනාගත් හොඳම පොහොර නිර්දේශය වූයේ බඳුනකට (පරිමාව ලීටර් 10) යූරියා ග්‍රෑම් 2.5 ක්, ERP ග්‍රෑම් 25 ක් සහ MOP ග්‍රෑම් 2.5 ක් මාස 03 ක කාල පරතරයකින් යෙදීමයි. විකල්පයක් ලෙස මාස 03 ක කාල පරතරයකින් බඳුනකට (ලීටර් 10) NPK 15-15-15 අඩංගු (K ප්‍රභවය SOP ලෙස ඇති) සංයුක්ත හෝ පොහොර NPK 12-11-18 (K ප්‍රභවය SOP ලෙස ඇති) සංයුක්ත පොහොර ග්‍රෑම් 01 ක් එකතු කිරීම මගින් පඳුරු ගම්මිරිස් වල වර්ධනය හා අස්වැන්න ඉහළ නැංවිය හැකි බව ද සොයා ගැනිණි.

- පහතරට තෙත් කලාපයේ තවාන් තුළ දී වසර 01ක් දක්වා වර්ධන අවධියේ දී ඒවායේ වර්ධන ලක්ෂණ සංසන්දනය කිරීමේ අධ්‍යයනයකින් හෙළි වූයේ, අධ්‍යයනය කරන ලද තෝරා ගත් ගම්මිරිස් වරණ සහ ප්‍රභේද අතරින් ඉහළම වර්ධන ලක්ෂණ සහ පැවැත්ම පෙන්වන ලද්දේ පැනියුර් ගම්මිරිස් ශාක මගින් බවය.

- කෝපි ජාන ප්ලාස්ම විස්තර කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, ලක් පැරකුම්, S9 HDT සහ කැටිමෝර් යන වඩාත් ප්‍රසිද්ධ ඇරබිකා කෝපි ප්‍රභේද රූපානුකූලව විස්තර කිරීමට හැකිවිය.

- රොබස්ටා කෝපි බීජ ප්‍රරෝහණය සඳහා ගතවන කාලය අඩු කිරීම සඳහා හොඳම ක්‍රමය වන්නේ සිටුවීමට පෙර කෝපි බීජයේ පාච්මන්ට් තට්ටුව ඉවත් කිරීම සහ ඊට අමතරව, බීජ පැය 24 ක් ජලයේ පොඟවා ගැනීමයි.

- තවාන් අවධියේ දී කෝපි පැළ අධික වර්ධනය (Overgrown) නිසා වන ගැටළුව මඟහරවා ගැනීම සඳහා ඒවායේ කඳ සහ මුල් කප්පාදු කිරීමෙන් පසු පැළ 10x12" ප්‍රමාණයේ බඳුන් වලට නැවත සිටුවීම නිර්දේශ කළ හැකිය. එහිදී බිම් මට්ටමේ සිට සෙන්ටිමීටර 20ක් උසින් කඳ කපා ඉවත් කළ යුතු අතර පැරණි බඳුනේ (8x5') පතුලේ සිට මූල පද්ධතියෙන් අඩක් ඉවත් කළ යුතුය. ඉන්පසු ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීමට පෙර මාස 04ක් තවානේ දී ශාකය ප්‍රවේශමෙන් නඩත්තු කළ යුතුය.

- කෝපි රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ලක් පැරකුම් සහ S9 අරාබිකා කෝපි වල ප්‍රාථමික මෙන්ම ද්විතියක ශාඛා වල කඳ කැබලි භාවිතා කිරීම ඉතා සාර්ථක විය. කෙසේ වෙතත් ද්විතියක ශාඛා භාවිතා කිරීම වඩාත් නිර්දේශ කෙරේ. එම ප්‍රාථමික හෝ ද්විතියක දඬු කැබලි වලින් 95% ක්ම වර්ධනය වූ ප්‍රධාන මුලු කෝපි බීජ පැළයේ මුදුන් මූලයට සමාන විය.

- කෝපි දුඹුරු අක්ෂි ලප රෝගයට හේතු වන සර්කොස්පෝරා කොෆිකෝලා (Cercosporacoffeicola) දිලීරයට එරෙහිව තෝරාගත් උද්භිද විද්‍යාත්මක සාරයන්හි ජෛව-කාර්යක්ෂමතාව පිළිබඳ ඇගයීමේ දී, රෝග කාරකය වන සර්කොස්පෝරා කොෆිකෝලා සඳහා විකල්ප පාලන ක්‍රමයක් ලෙස උද්භිද විද්‍යාත්මක සාරය භාවිතා කිරීමේ හැකියාව විද්‍යාගාර තත්ත්ව තුළ අනාවරණය වී තිබේ. කුරුඳු සෙයිලානිකම් පරීක්ෂණ දිලීරයේ අභ්‍යන්තර වර්ධනය වැළැක්වීම සඳහා ඉතා ඵලදායී බව ඔප්පු විය.

- කරාබු බීජ පැළවල තවාන් කාලය ප්‍රශස්ත කිරීම සඳහා, නිර්දේශිත බඳුන් මිශ්‍රණය (දිරාපත් ගොම පොහොර, වැලි, මතුපිට පස් සහ කොහුබත්1:1:1:1 අනුපාතයකින් අඩංගු) මාධ්‍යයන් පුරවා ඇති 10x12" බඳුන් වලට ඇල්බට් ද්‍රාවණය, සංයුක්ත පොහොර NPK 15-15-1- (Kප්‍රභවය SOP ලෙස ඇති ) ඩයි ඇමෝනියම් පොස්පේට් සහ යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට් මිශ්‍රණය වැනි විවිධ පොහොර වර්ග යොදන ලදි. පර්යේෂණාත්මක තත්ත්වයන් යටතේ ප්‍රතිකාර කරන ලද සියළුම කරාබු පැළ හොඳින් වර්ධනය වූ අතර ප්‍රතිකාර කිරීමෙන් මාස 06 කට පසු ඒවා ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීමට හැකිවිය.

- මහනුවර දිස්ත්‍රික්කයේ සාදික්කා බහුලව වගා කරන ප්‍රදේශවල සිදු කරන ලද සමීක්ෂණයකින් හෙළි වූයේ නිරීක්ෂණය කරන ලද ක්ෂේත්‍රවල සාදික්කා ගස් බොහොමයක් ගෙවතු ලෙස පැවති

බවය. තවද, එල දරන අවධියේ පැවති බොහෝ ශාකවල ඵලදායිතාවයට පැළ අතර පරතර ප්‍රමාණවත් නොවීම, ශාක වියන් අතිච්ඡාදනය වීම, පළිබෝධ සහ රෝග ආක්‍රමණ අහිතකර ලෙස බලපා තිබිණි. සමීක්ෂණය කරන ලද ක්ෂේත්‍රවල පසෙහි pH අගය සාදික්කා සඳහා හිතකර වූ අතර පසේ හුවමාරු කළ හැකි පොටෑසියම් සහ කාබන් ප්‍රමාණ ඉහළ මට්ටමක පැවතිනි. එහෙත් පසෙහි ප්‍රයෝජනයට ගත හැකි පොස්පරස් ඉතා අඩුය.

- සාදික්කා පටක රෝපණ ප්‍රචාරණයේ මූලික අදියර සඳහා විද්‍යාගාර ක්‍රමවේදය සකස් කරන ලදි.

- *Phyllostictazingiberi* දිලීරය මඟින් ඇති කරන ඉඟුරු පත්‍ර ලප රෝගය, ගඳපාන (Lantana, camara) තුල්සි *(Ocimumtenuiflorum)* සහ වල් සූරියකාන්ත (*Tithoniadiversifolia*)ආදියේ 50% ක ශාක සාරය පත්‍ර මත ඉසීමෙන් සාර්ථකව පාලනය කළ හැක.

- අධ්‍යයනවලින් හෙළි වූයේ ශ්‍රී ලංකාවේ බහුලව වගා කරන *Vanilla planifolia* ද ඇතුළත්ව හඳුනාගත් වැනිලා විශේෂ හතරක් ඇති බවය. අනෙකුත් වර්ග එනම් *V.wightti, V.mooni* සහ *V.walkari* දිවයිනේ ස්වභාවික පරිසර පද්ධතිවල වාර්තා වී ඇත. කෙසේ වෙතත්, මෑත වසරවලදී *V.wightti* නිරීක්ෂණය වී නොමැත. ඒ බොහෝ විට පාරිසරික වෙනස්කම් වාසස්ථාන අහිමිවීම හෝ සීමිත පර්යේෂණ හේතුවෙන් විය හැකිය. එම විශේෂ තුනේ නිදර්ශක එකතු කරමින් වැඩි විස්තර සොයා බැලීම දිගටම සිදු කරමින් පවතී.

- විවිධ බඳුන් ද්‍රව්‍යවල සංයෝජනයක් භාවිතා කරමින් බුලත් ප්‍රචාරණය සඳහා පිරිවැය අඩු බඳුන් මිශ්‍රණ ලෙස මතුපිට පස්:ගොම පොහොර : පස් : කොහු බත් : අර්ධ වශයෙන් පිළිස්සූ දහයියා 2:1:1:1:3 සහ මතුපිට පස්: ගොම පෙහොර අර්ධ වශයෙන් පිළිස්සුණු දහයියා 1:1:3 අනුපාතය නිර්දේශ කළ හැකි බව අනාවරණය විය.

- කෙන්යාවේ නයිරෝබි හි කෘෂි වන වගා පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF- ලෝක කෘෂි වන වගා පිළිබඳ මධ්‍යස්ථානය), පාංශු වර්ණාවලීක්ෂ විශ්ලේෂණ ඒකකයක් ලෙස අත්‍යවශ්‍ය උපාංග සහිත ALPHA II FT –IR වර්ණාවලීක්ෂයක් ස්ථාපිත කරන ලදි. හරිත දේශගුණික අරමුදල විසින් අරමුදල් සපයන ලද ශ්‍රී ලංකාවේ අවධානමට ලක්විය හැකි ගංගා ද්‍රෝණි, ජල පෝෂක ප්‍රදේශ සහ නකල්ස් කඳු වැටි ජල පෝෂක ප්‍රදේශයේ පහළ ප්‍රදේශවල පදිංචි යැපුම් ගොවීන්ගේ සහ කෘෂිකාර්මික ප්‍රජාවන්ගේ "දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම" නම් ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම සඳහා ලබා දෙන ලද මෙම උපකරණය ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමෙන් පසුව දෙපාර්තමේන්තුව වෙත මාරු කිරීමට ගිවිසුම් ගත ව ඇත. රජයේ දෙපාර්තමේන්තු , විශ්වවිද්‍යාල වලින් විවිධ පාර්ශවයන් මෙම උපකරණය හා සම්බන්ධ නව තාක්ෂණය පිළිබඳව පුහුණු කරන ලදි.

- නාරම්මල නව රසායනාගාර සංකීර්ණයේ බිම්මහලේ ඉදිකිරීම් IV වන අදියර 2024 වර්ෂයේ අවසන් කර ගත හැකි වීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයක් ලෙස හැඳින්වීමට පුළුවන.

- ශ්‍රී ලංකාවේ සාදික්කා (*Myristica fraganshoutt*)ජානප්ලාස්මයේ රූප විද්‍යාත්මක, ජෛව රසායනික සහ අණුක ලක්ෂණකරණය පිළිබඳ පර්යේෂණ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් පවත්වන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අනාගත බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සඳහා භාවිතා කිරීම සඳහා තෝරාගත් සාදික්කා ජානප්ලාස්ම ක්ෂේත්‍රගත ජාන බැංකුවක් ලෙස ස්ථාපිත කිරීම සිදු කරන ලදි.

- 2024 වර්ෂයේ දී ලංකාවේ විවිධ රාජ්‍ය පෞද්ගලික විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින් 34 දෙනෙකු එනම් මාතලේ අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයෙහි 26 දෙනෙකු, නාරම්මල, බුලත්සහ අතුරු වගා පර්යේෂණ මධ්‍යස්ථානයෙහි 07 දෙනෙකු සහ වල්පිට පටක රෝපණ පර්යේෂණ මධ්‍යස්ථානයෙහි එක් අයෙකු ලෙස ඔවුන්ගේ පර්යේෂණ සංරචකය සම්පූර්ණ කිරීමට සහ අදාළ විෂයයන් පිළිබඳ ක්ෂේත්‍ර සහ රසායනාගාර අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා ගෙන ඇත.

## පර්යේෂණ ප්‍රකාශන


1. බණ්ඩාර, W.G.S.V.T.E. වීරවර්ධන සහ H.A.W.S. ගුණතිලක (2024) බඳුන්වල වවන ලද පඳුරු ගම්මිරිස් ශාක වර්ධනයට මූලික සහ සංයුක්ත පොහොරවල බලපෑම, 22 වන කෘෂිකාර්මික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියාදාමයන් (2024), කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, පිටු 590- 594
2. ධර්මකීර්ති, H.S.T.E. වීරවර්ධන සහ G.E.M.විමලසිරි (2024) මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල කරාබු වගාවන්හි පාංශු සාරවත් බව සහ මයිකෝරයිසා ආසාධනය පිළිබඳ අධ්‍යයනය (2024). ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ 5 වන ජාත්‍යන්තර කෘෂිකාර්මික විද්‍යා සමුළුව,28
3. දිසානායක, D.M.P.V. (2024) කාර්යක්ෂමව බුලත් (පයිපර් බීටල්) ප්‍රචාරණය සඳහා පිරිවැය - අඩු බඳුන් මාධ්‍ය, විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ 4 වන ජාත්‍යන්තර සමුළුව (ICST),ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය.
4. දිසානායක,D.M.P.V. (2024) බුලත් වර්ධනය සහ අස්වැන්න සඳහා විකල්ප පොටෑසියම් ප්‍රභවයක් ලෙස අර්ධ වශයෙන් පුළුස්සා ගත් දහයියා භාවිතය, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ 8 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව.
5. දිසානායක, H.M.S.Y, D.G.H.M.K.දිසානායක සහ H.A.W.S. ගුණතිලක, (2024). ඇරබිකා කෝපි ලක් පැරකුම්, S9, HDT, සහ කැටිමෝර් ප්‍රභේදවල වර්ධන සහ ප්‍රජනක අවධියේ විවිධ ලක්ෂණ; https:www.researchgate.net/publication/388069160_Varietal_Characterization_of_Arabica_cofee_coffra_arabica_L_Varities_Lakperakum_S9 HDT_ and Catimor_in_the Vegetative and Reproductive Phase.

6. ඉඳුරුව විදාන ආරච්චිගේ දොන්, C.S.I. ජිට්ටනිට්, W. සහ ලොර්ජරොළුන්ෆොන්.Y.2024. ඉසින හෝ ශීත කළ - වියළීමේ ශිල්පීය ක්‍රමවල ගුණාත්මකභාවය තීරණය කිරීම සහ ගම්මිරිස් ඔලියොරෙසින් කැප්සියුලකරණය කිරීම. වියළීමේ තාක්ෂණය 42(6), 1098-1115
7. මුදියන්සේලාගේ නිලාන් සුදත් දයාරත්න, හර්ෂ මනෝජ් කුමාර දිසානායක, අරුණි වීරසිංහ, එරන්දි මධුෂිකා කුමාරි රන්දෙණිය, (2024) කහ (Curcuma longa L.)පටක රෝපිත පොලිප්ලොයිඩ් නිෂ්පාදනය මත Colchicine වල බලපෑම පිළිබඳ අධ්‍යයනය, කෘෂි විද්‍යාව සහ කෘෂිකාර්මික පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර සඟරාව (IJAAR)..http:// www.inspub.net
8. මුණසිංහ, M.S.S.,හේරත්, M.K. හර්ෂණී, K (2024) විවිධ බීජ ප්‍රතිකාර සමඟ රොබස්ටා කෝපි (කෝෆියා කැනෙෆෝරා) වල බීජ ප්‍රරෝහණ කාර්ය සාධන ඇගයීම, ICIET 2024, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
9. මුණසිංහ, M.S.S., නස්රා, M.N.F, සතරසිංහ D.(2024) ශ්‍රී ලංකාවේ තවාන්වල වැනිලා පැළ නිෂ්පාදනය කෙරෙහි කඳ එල්ලා තිබෙන කාල සීමාව සහ වැනිලා පුරුක් ගණනෙහි බලපෑම ඇගයීම, ජාතික ගොඩනැඟීම සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ දොරටුව (2024), රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.
10. නිර්ෂාන් M.A.A., D.G.H.M.K. දිසානායක, N.M.C. නයනකාන්ත සහ R.M.E.M. රන්දෙණිය. (2024) කහ (Curcuma longa L) කැලස් නිෂ්පාදනය සඳහා පටක රෝපණ ක්‍රමවේදය හඳුනාගැනීම. https://www.researchgate.net/publication/382553425 Identification of high throughput in vitro culture protocol for turmeric Curcuma longa L callus production.
11. නුවරවැව, S.W.N.W.C.S., T.E. වීරවර්ධන සහ H.A.W.S. ගුණතිලක, (2024). විවිධ පොහොර සංයෝජන මඟින් කරාබු (Syzygium aromaticum L) බීජ පැළ තවාන් කාලය ප්‍රශස්ත කිරීම. 22 වන කෘෂිකාර්මික පර්යේෂණ සම්මන්ත්‍රණයේ (2024), කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය, පිටුව 660-664
12. ප්‍රේමරත්න, M.G.D.S.T.E. වීරවර්ධන සහ H.A.W.S. ගුණතිලක, (2024). මහනුවර දිස්ත්‍රික්කයේ සාදික්කා වගාවන්හි පාංශු සාරවත් බව සහ පෝෂක කළමනාකරණ පිළිවෙත් පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණ.22 වන කෘෂිකාර්මික පර්යේෂණ සම්මන්ත්‍රණයේ (2024), කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය, පිටුව 680-684
13. රණසිංහ H.N.M,, W.M.R.W.B. විජේකෝන්, N.M.C. නයනකාන්ත සහ K.A.R.D. කොඩිතුවක්කු, (2024). Cercosporacoffeicolaනිසා ඇතිවන කෝපි වල දුඹුරු අක්ෂි ලප රෝගයට එරෙහිව තෝරාගත් උද්භිද විද්‍යාත්මක සාරයන්හි ජෛව - කාර්යක්ෂමතාව පිළිබඳ අභ්‍යන්තර ඇගයීම. ශ්‍රී ලංකාවේ බදුල්ල, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 8 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව. පිටු .118
14. රූපසිංහ, P.A.H.I.K.D.N. ප්‍රියදර්ශනී, සහ L.N. වීරසිංහ (2024). වැනිලා (වැනිලා ප්ලැනිෆෝලියාව) අභ්‍යන්තර අංකුර ගුණ කිරීම සඳහා වන්ධ්‍යාකරණ ක්‍රියාදාමයන්ගේ කාර්යක්ෂමතාව සංසන්දනය, SLCSS සහ Pub Ad අමාත්‍යාංශය එක්ව සංවිධානය කරන ලද පර්යේෂණ සම්මන්ත්‍රණය, පිටුව. 42.

15. රූපසිංහ, P.A.H.I.K.D.N. ප්‍රියදර්ශනී, සහ L.N. වීරසිංහ (2024). ගම්මිරිස් සඳහා විකල්ප පෝච්චි මිශ්‍රණය ඇගයීම නවෝත්පාදන සහ නැගී එන තාක්ෂණයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, පිටු 44
16. සහ්ලා, M.J.F, D.G.H.M.K. දිසානායක, ඉන්දික කමනි හේවාවිතාරණ, සහ R.M.E.M.K. රත්දෙණිය. (2024) ඉහළ කැලස් නිෂ්පාදනය ඉලක්ක කරගත් වැනිලා (වැනිලා ප්ලැනිෆෝලියා ඇන්ඩෘස්) සඳහා කැලස් වගා ප්‍රොටෝකෝල ප්‍රශස්තකරණය කිරීම. https://www.researchgate.net/pub(Edited)
17. සමරකෝන්, එස්.එම්.අයි.එම්. විජේකෝන්, ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්.බී. කුමාරි, පී.ඩී.එස්. යූ.මුතුරන්වැලිගේ, ඩී.ඩී.සහ කොඩිතුවක්කු, ආර්.ඩී.(2024). වැනිලා ප්ලැනිෆෝලියා හි මුල් කුණුවීම සහ කඳ කුණු වීමේ රෝග සඳහා හේතුකාරක ජීවීන් හඳුනා ගැනීම සහ ඒවා කළමනාකරණය කිරීම පිළිබඳ අධ්‍යයනයක්. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 08 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, බදුල්ල, ශ්‍රී ලංකාව. පි.142.
18. සිල්වා,එස්.අයි.සී.ධර්මපරාක්‍රම, ඒ.එල්.එස්, මුණසිංහ, එස්.එස්. ශාමක,ඩබ්ලිව්. ඒ.ඒ.එච්., ශාන්ත කේ.පී.ජී., අමරකෝන්, එස්, මල්කාන්ති, එම්.එම්.එස්., (2024), ශ්‍රී ලංකාවේ පහතරට අතරමැදි කලාපයේ වගා කිරීම සඳහා දේශීය ඉඟුරු ඇගයීම.2024 නවෝත්පාදන සහ නැගී එන තාක්ෂණයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ ක්‍රියාදාමයන්. පි.46. 2024 නොවැම්බර් 21-22 දිනවල පැවැත්විණි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය, මාහේනවත්ත, පිටිපන උතුර, හෝමාගම, 10206, ශ්‍රී ලංකාව විසින් සංවිධානය කරන ලදි.
19. සිල්වා, S.I.C., මුණසිංහ, M.S.S. ශාන්ත, K.G.P.ශාමක, W.A.A.H., (2024),ශ්‍රී ලංකාවේ පහතරට අතරමැදි කලාපයේ පොල් වගාව යටතේ අතුරු බෝග ලෙස වගා කරන ලද චීන සහ රන්ගුන් ඉඟුරු වල රූප විද්‍යාත්මක ලක්ෂණ සහ අස්වැන්න ඇගයීම. විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සිව්වන ජාත්‍යන්තර සමුළුව (ICST 2024), ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය, පි.24
20. විජයරත්න, J., ඉඳුරුව, S., ප්‍රියදර්ශනී, D., විජයපාල, S., සහ සමරවික්‍රම,R. (2023). කපු රෙදි සඳහා ස්වභාවික සායම් වල ජලීය නිස්සාරණය සහ සායම් කිරීමේ හැසිරීම. ශ්‍රී ලංකා තාක්ෂණ මණ්ඩපයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව කොළඹ, ශ්‍රී ලංකාව. දෙසැම්බර් 14-15

## 2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

### 2.2.1. අභියෝග

1. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය භෞතික පහසුකම් ප්‍රශස්ත මට්ටමෙන් නොපැවතිම එනම්නි ලධාරින් සඳහා කාර්යාල පහසුකම්, උපකරණ හා භාණ්ඩ අවශ්‍යතාවයන් හා ප්‍රවාහන පහසුකම් නියමිත පරිදි සැපයීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව සතුව නොමැති වීම අභියෝගයක් විය.

2. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමඟ විද්‍යාත්මක සේවයේ නිළධාරීන් යම් ප්‍රමාණයක් එම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීම හේතුවෙන් ඇතැම් දිස්ත්‍රික්කවල සංවර්ධන කටයුතු සිදු කර ගෙන යාමේදී ගැටළු සහගත තත්වයන් ඇති විය.

3. ශාකවල වර්ධනයට සහ ප්‍රජනන හැසිරීමට ඍජුවම බලපාන දේශගුණික විපර්යාසවල ප්‍රතිවිපාකවලට විසඳුම් සෙවීම අපනයන කෘෂිකාර්මික පර්යේෂණ අංශයට පැවරී ඇති අභියෝගයකි. වටිනාකම් දාමයේ ඇති හිඩැස් පිරවීම සඳහා වෙළඳපොළ පදනම කරගත් පර්යේෂණ සහ සමාජ පර්යේෂණ වැඩි වැඩියෙන් සිදු කිරීම ද අවශ්‍ය වේ. එසේම අනාගත පර්යේෂණවල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා අපනයන කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධනයට අදාල යටිතල පහසුකම් සහ මානව සම්පත් හිඟතාවයට විසඳුම් සෙවිය යුතුය.

## 2.2.2. අනාගත ඉලක්ක / අරමුණු

- 2025 සිට 2030 දක්වා අපනයන පරිමාව 30% කින් ඉහළ නැංවීම

  අපනයන බෝග නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් වසර 2030 වන විට අපනයන පරිමාව 30% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කය කරා යාමට අපේක්ෂා කරන අතර මේ සඳහා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන ප්‍රභේද සහ වගා පිළිවෙත් හඳුන්වාදීම හා අනුගමනය කිරීම තුලින් නිෂ්පාදනය ඉහළ නැංවීමට බලාපෙරොත්තු වේ. මේ යටතේ කෝපි සහ කොකෝවා ආනයනය 25% කින් අවම කිරීම සහ එම වගාවන් ප්‍රවර්ධනය කිරිමට අපේක්ෂා කෙරේ.

- අපනයන ආදායම ඉහළ නැංවීම.

  2030 වසර වන විට අපනයන ආදායම 80% කින් ඉහළ නැංවිම අපේක්ෂා කරන අතර මේ සඳහා අලෙවි දාමය සහ වෙළෙඳපොල සංවර්ධනය, අගය එකතු කළ නිෂ්පාදන හා ගුණාත්මය ඉහළ නැංවිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට අපේකෂා කෙරේ. මේ යටතේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන උචිත තාක්ෂණයන් හඳුන්වා දීම, ප්‍රමිතිකරණය ඉහළ නැංවීම සඳහා විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම, ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරිම හා පවත්වා ගැනීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සුදුසු පරිසර තත්ත්ව ඇති කිරීම, අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නව වෙළෙඳපොලට අවස්ථා හඳුනාගැනිම හා වෙළඳපොල බාධාවන් හඳුනාගෙන ඒ සඳහා විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. විභවතාවයන් පවතින නව බෝග හඳුනාගැනිම සඳහා වෙළඳපොල අවස්ථා හඳුනාගැනීමට අපේක්ෂා කෙරේ.

- අපනයන කෘෂි පාර්ශ්වකරුවන්ගේ ධාරිතා සංවර්ධනය

  අපනයන කෘෂි බෝග පාර්ශ්වකරුවන්ගේ දැනුම, ආකල්ප සහ සම්පත් සංවර්ධනය තුලින් පාර්ශ්වකරුවන් අපනයන කෘෂි බෝග කෙරෙහි දක්වන දායකත්වය ඉහළ නැංවිමට අපේක්ෂා කෙරේ. ව්‍යාප්ති සේවයේ තාක්ෂණික හැකියාව ශක්තිමත් කිරීම සඳහා ඩිජිටල්කරණය තුලින් නව අපනයන කෘෂි බෝග ව්‍යාප්ති ක්‍රමවේදය සකස් කිරීමට බලාපොරොත්තු වේ. 2025 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත Clean Sri Lanka වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුව මඟින්

ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා මෙතෙක් යොදා ගනු ලබන ව්‍යාප්ති ක්‍රමවේදය, ඩිජිටල්කරණය තුලින් සීග්‍රවත් කිරීමට බලාපොරොත්තු වේ. තවද, ධාරිතා වර්ධන වැඩසටහන යටතේ සේවා සංස්කරණ මධ්‍යස්ථානය මඟින් NVQ මට්ටමේ සහතික ලබා දීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට බලාපොරොත්තු වේ. තවද පර්යේෂණ හා ව්‍යාප්ති අංශයේ දැනුම හුවමාරුව සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට බලාපොරොත්තු වේ. නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් වැඩ පරිසරය සංවර්ධනය කිරීමට ද අපේක්ෂිතයි.

- අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නීතිමය රාමුව ශක්තිමත් කිරීම.

  පවතින අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නීතිමය රාමුව අධ්‍යයනය කර අවශ්‍ය නිර්දේශයන් ලබා දීම, මෙහෙයුම හා ඇගයීම සඳහා එහි විස්තරාත්මක රාමුවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

- කුරුඳු බෝගය දෙපාර්තමේන්තුවෙන් ඉවත් වීමත් සමඟ අනෙකුත් අපනයන කෘෂි බෝග වගාවන් සංවර්ධනය කිරීම.

  ඉදිරි වසර කීපය තුළ වතු අංශයේ මහා පරිමාණයෙන් ගම්මිරිස්, කෝපි, කොකෝවා , වැනිලා වැනි වගාවන් ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන අතර මේ සඳහා වතු අංශයේ මෙන්ම විභවතාවය පවතින අනෙකුත් ප්‍රදේශ කරා අපනයන කෘෂි බෝග වගාවන් ප්‍රචලිත කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා විශේෂයෙන්ම වතු අංශයේ ඉහළ කළමනාකාරීත්වය හා නිළධාරින් සමඟ සාකච්ඡාවන් හා වැඩමුළු පැවැත්වීමට කටයුතු කිරීම මඟින් වතු අංශය තුළ මහා පරිමාණයෙන් අපනයන කෘෂි බෝග වගා ව්‍යාප්ත කිරීමට නියමිත අතර ඒ සඳහා සියළුම නිළධාරීන්ගේ සක්‍රීය දායකත්වය ලබා දීමට අපේක්ෂා කෙරේ.

- අපනයන කෘෂි බෝග සඳහා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.

  සංචාරක කර්මාන්තය ආශ්‍රිතව අපනයන කෘෂි බෝග ප්‍රචලිත කිරීම සඳහා කුළුබඩු උද්‍යාන, Coffee Shop සකස් කිරීම හා ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය දැක්වීම තුළින් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය කෙරෙහි සංචාරක ආකර්ෂණය කර ගැනීම තුළින් වැඩි ආදායමක් ලබා ගැනීමට බලාපොරොත්තු වන අතර එම ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

- අපනයන කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම අපනයන කෘෂි පර්යේෂණ හා සංවර්ධනයේ ප්‍රධාන ඉලක්කයයි. එබැවින්, ඒ සඳහා තිරසාර ගොවිතැන් පිළිවෙත් දිරිමත් කිරීම සහ ගොවි ක්ෂේත්‍ර තුළ උසස් නූතන තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම වැදගත්ය. කෝපි, කරාබුනැටි, සාදික්කා, කොකෝවා, වැනිලා සහ පැඟිරි බෝග පිළිබඳ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ. අනාගත පර්යේෂණ සැලසුම් කිරීමට, පර්යේෂණ දත්ත ගබඩා කිරීමට සහ කළමනාකරණයට ඩිජිටල්කරණය භාවිතා කිරීම අනාගත ඉලක්කයකි. පර්යේෂණ සඳහා ඇති අඩු ප්‍රාග්ධන ආයෝජන වල ගැටළු අවම කර ගැනීමට

අපනයන කෘෂිකාර්මික පර්යේෂණ සඳහා බාහිර කාර්මික ආයතන වල සහයෝගීතාවය දිරිමත් කළ යුතුය.  පර්යේෂණ රසායනාගාර සඳහා ප්‍රතීතන සහතික ඇතුළුව රසායනාගාරවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය.

නිර්දේශ කරමි.



එම්.කේ.එස්. ආර්.ඩී. සමරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ),
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

එම්.කේ.එස්.ආර්.ඩී. සමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ)
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, ගැටඹේ,
පේරාදෙණිය.

අනුමත කරමි.

ඩී.පී. වික්‍රමසිංහ,
ලේකම්,
කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍යාංශය

ඩී.පී. වික්‍රම
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, ''ගොවිජන මන්දිරය''
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

# පරිච්ඡේදය 03

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය** **ඒ.සී.ඒ -එෆ්**

රු.

| සංශෝධිත අයවැයප්‍රතිපාදන 2024 | | සටහන | තතය 2024 | 2023 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවාමත බදු | 2 | | | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මතබදු | 3 | | | |
| - | බදු නොවන ආදායම් භාවෙනත් | 4 | | | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | | | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| 1,397,292 | භාණ්ඩාගාර අග්‍රිම | | 1,306,306,000 | 1,272,125,000 | ඒසීඒ-3 |
| | තැන්පතු | | 110,166,003 | 239,124,066 | ඒසීඒ-4 |
| 35,000,000 | අත්තිකාරම් ගිණුම් | | 59,302,706 | 48,021,175 | ඒසීඒ-5/5(ඒ) |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | | |
| 36,397,292 | මුළු ආදායම් නොවනලැබීම් (ආ) | | **1,475,774,709** | **1,559,270,241** | |
| 36,397,292 | මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **1,475,774,709** | **1,559,270,241** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 54,301,524 | 21,496,362 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම්ඉ=(අ)+(ආ) | | 1,421,473,185 | 1,537,773,879 | |
| | අඩුකළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | | | |
| 898,490,000 | වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 840,940,616 | 744,889,990 | |
| 120,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 79,476,571 | 81,163,045 | ඒසීඒ-2(ii) |
| 18,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 12,190,219 | 12,995,560 | |
| | පොළී ගෙවීම් | 8 | | | |
| | වෙනත් පුනරාවර්තනවියදම් | 9 | | | |
| 1,036,490,000 | මුළු පුනරාවර්තනවියදම් (ඊ) | | **932,607,406** | **839,048,595** | |
| | මූලධන වියදම් | | | | |
| 43,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හාවැඩිදියුණු කිරීම | 10 | 39,204,810 | 22,269,232 | |
| 45,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 39,165,440 | 4,146,346 | |
| 400,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 369,931,717 | 387,697,746 | ඒසීඒ-2(ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | | |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 478,978 | 792,433 | |
| 28,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 21,934,062 | 6,412,910 | |
| 517,000,000 | මුළු මූලධන වියදම් (උ) | | **470,715,007** | **421,318,667** | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | | | |
| | තැන්පතු ගෙවීම් 14 | | 47,314,985 | 315,896,357 | ඒසීඒ-4 |
| 50,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 54,141,150 | 46,797,548 | ඒසීඒ- |
| 50,000,000 | ප්‍රධාන ලෙජර්වියදම් (ඌ) | | 101,729,135 | 362,693,905 | |
| 1,603,490,000 | මුළු වියදම් එ= (ඊ+උ+ඌ) | | 1,505,051,548 | 1,623,061,167 | |
| - | **…2024..දෙසැම්බර් 31 දිනට ශේෂය= (ඉ-එ)** | | (83,578,363) | (85,247,288) | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 3,204,936 | (85,247,288) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | ......(83,578,363) | ............................ | ඒසීඒ-3 |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.

ACA-P

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ACA-6 | 1,476,642,590 | 1,448,474,902 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ACA-5/5(අ) | 124,089,013 | 128,977,569 |
| මුදල් හා මුදල් සමාන දෑ | ACA-3 | - | - |
| මුළු වත්කම් | | 1,600,731,603 | 1,577,452,471 |
| **ශුද්ධ වත්කම් / සාධාරණය** | | | |
| හා ජනිත ශුද්ධ වත්කම් | | 48,177,273 | 119,121,784 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,476,642,591 | 1,448,474,902 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ACA-5(ආ) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ACA-4 | 72,706,804 | 9,855,785 |
| අයිරාව | ACA-3 | 3,204,936 | - |
| මුළු වගකීම් | | 1,600,731,603 | 1,577,452,471 |

මෙහි අංක...01....සිට ...39..... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කරනලද ගිණුම් සංක්ෂිප්ත සහ ඇමුණුම් පිටු අංක ...40.... සිට ...55.... දක්වා ආකෘති ගිණුම් [illegible] මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2021.12.16 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 06/2024 [illegible] [illegible]

මූල්‍ය පාලනය සඳහා [illegible] සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
ඩී.ඩබ්.ඒ.ඩබ්. කුමාරසිංහ
ලේකම්
කම්කරු, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

ගණන්දීමේ නිලධාරී
නම
තනතුර :
දිනය :

එම්.එස්.එස්.ආර්.ඩී. සමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
පේරාදෙණිය.

~~ප්‍රධාන මූල්‍ය නිලධාරී~~/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ ගණකාධිකාරී (මුදල්)
නම :
දිනය : 2025/02/21

2

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඒසීඒ-සී

**.......2024-12-31.......... දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහප්‍රකාශය**

| | තකය 2024 රු. | 2023 රු. |
|---|---|---|
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 96,196,223 | 101,548,526 |
| අග්‍රිම ලැබීම | 1,306,306,000 | 1,272,125,000 |
| අත්තිකාරම් අයකර ගැනීම | 49,092,927 | 49,036,854 |
| තැන්පතු ලැබීම් | 110,166,003 | 239,124,066 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,561,761,153** | **1,661,834,447** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 917,614,697 | 822,708,145 |
| සහනාධාරසහ මාරුකිරීම් | 12,190,219 | 12,995,560 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | 52,654,154 | 27,738,095 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 54,301,524 | 21,496,362 |
| අත්තිකාරම් ගෙවීම් | 54,935,400 | 46,595,756 |
| තැන්පතු ගෙවීම් | 47,314,985 | 315,896,357 |
| **මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,139,010,979** | **1,247,430,275** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **422,750,174** | **414,404,172** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | |
| උපණය අයකර ගැනීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | 419,545,238 | **414,404,172** |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම් | 419,545,238 | **414,404,172** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) (ඉ)** | | - |
| **ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **3,204,936** | **(** |
| <u>**මූල්‍ය ක්‍රියාකාකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | - | - |
| දේශීය ණය ආපසු ලෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ලෙවීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | |

## 3.4. මුල්‍ය ප්‍රකාශ සටහන්

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව (රුපියල් මිලියන) | අවසන් ඇස්තමේන්තුව (රුපියල් මිලියන) | ප්‍රමාණය (රු.) (මිලියන) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002-01-01 | රජයේ ගොඩනැඟිලි කුලී | 2600 | 2600 | 3209.1 | 123.4 |
| 2002-02-99 | ණය පොලිය - අනෙකුත් | 5500 | 5500 | 5418.07 | 98.5 |
| 2003-01-00 | විකුණුම් සහ ගාස්තු - දෙපාර්තමේන්තු විකිණීම් | 45700 | 55000 | 47609.3 | 86.56 |
| 2003-02-99 | විකුණුම් හා ගාස්තු-පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ | 250 | 1000 | 97.5 | 9.75 |
| 2003-99-00 | විකුණුම් හා ගාස්තු-අනෙකුත් ලැබීම් | 3000 | 3000 | 1980.26 | 66.00 |
| 2006-02-02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම - වෙනත් | 00 | 00 | 70.0 | |

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු, 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස |
| පුනරාවර්තන | 933,000 | 1,036,490 | 932,607.4 | 89.98 |
| ප්‍රාග්ධන | 517,000 | 517,000 | 470,715.0 | 91.05 |
| එකතුව | 1,450,000 | 1,553,490 | 1,403,322.4 | 90.35 |

## 3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු, 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01. | වැවිලි අමාත්‍යංශය | | 36686 | 16686 | 8197.4 | 49.1 |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2024දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2024දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි හා ව්‍යුහයන් | 5,474,78.0 | 5,474,78.0 | | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 341,151 | 341,151 | | 100 |
| 9153 | ඉඩම් | 5,880,13 | 5,880,13 | | 100 |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9. විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. : සිපිසිජී/කේඩි/එෆ්/ඩීජ්පිඑච්/බිසි/2024/60
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2025/06/09

ගණන් දීමේ නිලධාරී,

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ශීර්ෂය - 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

23 JUN 2025

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

ශීර්ෂය - 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය , මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

649

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පිණිස අවශ්‍ය අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සංධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන් , වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයෙන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයන් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය මත අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය වූ රු.1,448,474,902 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) ආරම්භක ශේෂය යටතේ දැක්විය යුතු වුවත් එම ශේෂය රු.810,416,523 ක් ලෙස දක්වා ඉතිරි වටිනාකම වූ රු.638,058,379 ක් ආරම්භක ශේෂයට එකතුකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම රු.470,236,029 කින් වර්ෂයේ ප්‍රාග්ධනීත කිරීම රු.11,225,741 ක් එනම් මුළු මූලධන වියදමින් සියයට 2 ක් විය. නියැදි පරීක්ෂණයට අනුව මූලධන වියදම් ලෙස දරන ලද එකතු වටිනාකම රු.10,863,751 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඇ) ආයතනය සතු සියලුම ඉඩම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ-6) විධිමත් තක්සේරු අගයකට ගිණුම් ගත කළ යුතු නමුත් වටිනාකම රු.155,000,000 ක් වූ දැල්පිටිය උප පර්යේෂණ මධ්‍යස්ථානයට අයත් ඉඩම ගිණුම් ගත කර නොතිබුණි.

4

### 1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) මුල්හාල්කැලේ මධ්‍යම පැළ තවාන් භූමියෙන් පර්චස් 128 ක භූමි ප්‍රමාණයක් කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබූ අතර භූමිය ලබාදීමෙන් ආයතනය ලබාගත් ප්‍රතිලාභයක් හෝ භූමිය ලබාදීමට අදාල අනුමැතීන්, ගිවිසුම් යනාදී කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ආ) i. 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම මාර්ගෝපදේශයේ 1.1.1 , 2.3 ප්‍රකාර වෘත්තිය සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු මඟින් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) ගිණුම් ගත කළ යුතුවේ. නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට කේත අංක 9151, 9152, 9153 යටතේ ගිණුම්ගත කර තිබූ එකතුව රු.1,476,642,590 ක් වූ මූල්‍ය නොවන වත්කම් වල එසේ තක්සේරු කිරීමට අදාළ අගය සනාථ කිරීම සඳහා අදාළ තක්සේරු වාර්තාමය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

ii. එමෙන්ම යථෝක්ත මාර්ගෝපදේශයේ 1.3.1, 2.3, 4.3 වගන්ති ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් සෑම වර්ෂ 05 කට වරක්ම තක්සේරු කළ යුතු වුවත් එම නියමයෙන් බැහැරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පවතින මූල්‍ය නොවන වත්කම් වර්ෂ 05 කට වරක් නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඊට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) මාතලේ දිස්ත්‍රික් කාර්යාලය සහ මාතලේ මධ්‍යම පැළ තවාන වෘක්ෂලතා ලේඛනයද, මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ එලදා ලේඛනයද යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

5

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| ශීර්ෂය - 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 154(6) වාර්තාව | | |
| (අ) 1.6.3. | වෘක්ෂලතා ලේඛනය, එළදා ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු බව | 1.6.3 |
| (ආ) 2.1 | පනතේ නියමයන් ප්‍රකාරව ක්‍රියාකළ යුතු බව | 3.2.(අ) |
| (ඇ) 3.4.(ආ) | වාහන පූර්ණ උපයෝජනය කළ යුතු බව | 4.2.(ඊ), |
| (ඈ) 3.5.(අ) | වාහන ඵලදායීව උපයෝජනය කළ යුතු බව | 4.2.(උ) |
| (ඉ) 3.2(ඊ) | වත්කම් පූර්ණ උපයෝජනය කළ යුතු බව | 4.2.(ඌ) |
| (ඊ) 3.7(ඈ) | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම සිදුකළ යුතු බව | 4.2.(එ) |
| (උ) 3.5 | හානි හා පාඩු සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණ පවත්වා අලාභ අයකළ යුතු බව | 4.3.(ආ) |
| (ඌ) 3.4.(ඈ) | පැළ තවාන් උපරිම ධාරිතාවයෙන් යුතුව ක්‍රියාත්මක කළ යුතු බව | 4.4.(ඉ) |

6

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. වියදම් කළමනාකරණය

(අ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 8 ක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන රු.102,000,000 න් රු.16,603,635 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණු අතර එම ප්‍රතිපාදන ඉතිරිවීම මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් 91 ත් අතර පරාසයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කැපැල් හා සන්නිවේදන වියදම් ලෙස රු.6,449,216 ක් දරා තිබූ නමුත් කැපැල් හා සන්නිවේදන වියදම් වලට අදාළ වැය විෂයය වූ 289-2-1-0-1402 යටතේ වාර්ෂික ශුද්ධ ප්‍රතිපාදනය රු.6,000,000 ක් විය. ඒ අනුව අදාළ වියදමේ වාර්ෂික ශුද්ධ ප්‍රතිපාදන සීමාව ඉක්මවීම රු.449,216 ක් 289-2-1-0-1409 වෙනත් වැය විෂයය යටතේ දරා තිබුණි.

### 3.2. නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පැවතුණි.

| | නීති , රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | පනත් | | |
| | 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනතේ 15 වගන්තිය | 289,964,900 | අමාත්‍යවරයා විසින් නියෝග සැදීමකින් තොරව 2023 වර්ෂයේදී ප්‍රතිලාභීන් වෙත අපනයන ප්‍රවර්ධන ආධාර ගෙවීම් කර තිබුණි. |
| i. | මුදල් රෙගුලාසි 785(iii)ආ | 117,112 | අලුත්වැඩියාවේ ස්වභාවය මත අවශ්‍ය අමතර කොටස් හා සේවා ලබා ගැනීමට නියෝජිත ආයතනය මගින් හෝ මිල කැඳවීම් සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. |

7

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2015 වර්ෂයෙන් පසුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අපනයනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලු සංවර්ධන වැඩසටහන් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සැලසුම් කළ යුතු වුවත් පුත්තලම දිස්ත්‍රික්කයේ සැලසුම් කර තිබූ වැඩසටහන් 6 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් යටතේ එක් එක් ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශ 14 ක ප්‍රගතිය සියයට 50 ට වඩා පහළ මට්ටමක පැවතුණි.

4.1.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවි පුහුණු වැඩසටහන් 12 ක් හා ප්‍රතිලාභීන් 180 ක් සඳහා ඉලක්ක ලබා දී තිබුණද එහි ප්‍රගතිය පුහුණු වැඩසටහන් 04 ක් හා ප්‍රතිලාභීන් 50 ක් පමණක් වූයෙන් ප්‍රගතිය පිළිවෙලින් සියයට 33 ක් හා සියයට 28 ක් වැනි පහළ අගයක පැවතුණි.

(ආ) එක් එක් පළාත් සහ දිස්ත්‍රික් වශයෙන් පැළ ඉලක්ක ලබා දී තිබූ අතර ඒ සඳහා ගොවීන් තෝරාගෙන ක්ෂේත්‍ර යේ සිටු වීම සඳහා පැළ ලබා දී තිබුණි. නමුත් භෞතික පරීක්ෂාවේදී පැළ විනාශ වීම , නඩත්තුවකින් තොරව පැවතීම, අස්වනු ලබා ගන්නා තෙක් පසුවිපරම් නොකිරීම ආදී හේතු මත පැළ ඉලක්කවලින් 50% අඩු ප්‍රගතියක් දක්නට ලැබුණි.

(ඇ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල පැළ නිෂ්පාදනය ධාරිතාවය තිරණය කිරීමේදී පදනම් කරගනු ලබන නිර්ණායකයන් මොනවාද යන්න කහවුරු නොවුණි. දැනට එම පැළ තවාන්වල පවතින උපරිම ධාරිතාවය හා වර්තමාන නිෂ්පාදනය අතර සැලකූ විට විශාල වෙනස්කම් පැවති අතර එය සියයට 18 සිට සියයට 64 දක්වා පරාසයක පැවතුණි. මේ අනුව ක්ෂේත්‍රගත කළ හැකි වූ පැළ ප්‍රමාණය 1,181,742 කින් අඩු වී පැවතුණි.

(ඇ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය අනුව ගම්මිරිස් වැළකින් වියළි ගම්මිරිස් කිලෝග්‍රෑම් 01 ක් ලබා ගත හැකි ව තිබූ අතර සියලු තාක්ෂණික දැනුම භාවිතා කරමින් පවත්වා ගෙන යනු ලබන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වල්පිට පටක රෝපණ මධ්‍යස්ථානය සතු ගම්මිරිස් වැල් වලින් ලැබූ ඵලදාව නිර්දේශිත ඉලක්කයෙන් සියයට 65 කින් අඩු වී තිබුණි.

(ඉ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික හා ප්‍රධාන කාර්යයක් වනුයේ අපනයන කෘෂිකාර්මික භෝග ව්‍යාප්තිය සිදු කිරීම වන අතර ඒ සඳහා පසුගිය වසර 11 ක කාලය තුළ රු.මිලියන 2507 ක් වැය කර තිබුණද, 2012 වර්ෂයට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දින වන විට භෝග වර්ග 05 ක ක්ෂේත්‍රයේ පවතින බිම් ප්‍රමාණය අක්කර 15,875 කින් හෙවත් සියයට 21 කින් අඩු වී තිබුණි.

(ඊ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අපනයන බෝගයක් වන කොකෝවා හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා 2023 වර්ෂයේදී රු.මි.8,846 ක් වියදමක් දරා තිබූ අතර මෙම නිෂ්පාදනය මෙරට තුළ පරිභෝජනයට අවශ්‍ය තරමට භෝ නිෂ්පාදනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මෙරට අපනයන බෝග ආනයන වියදමින් සියයට 82 ක් ම ඒ සඳහා යොදවා තිබුණි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙරට අවශ්‍යතාවය ගැලපුම් කිරීම වැඩිදියුණු කිරීම හා එකලස් කිරීම යන කරුණු සඳහා උචිත වැඩ පිළිවෙලක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් මෙම ආනයන වියදම් ඉහළ ගොස් තිබුණි.

(උ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු මධ්‍යස්ථාන, පැළ තවාන් හා නිල නිවාස 09 ක් සතු ඉඩම් අක්කර 15.28 ක් කිසිදු ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා නොගෙන ඌණ උපයෝජිතව පැවතුණි.

4.2 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පරිහරණය කරන අක්කර 365 ක ඉඩම් කොටස් 30 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයිතිය පවරාගෙන නොතිබුණි.

9

(ආ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව භාවිතා කරන වෙනත් අමාත්‍යාංශයට අයත් වාහන 25 ක් පවරා ගැනීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි.

(ඇ) රු.244,375 ක වටිනාකමකින් යුත් වල්පිට පටක රෝපණ මධ්‍යස්ථානයේ විදුරුම් ජල පද්ධතිය වර්ෂ 03 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) නාරම්මල අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ මෙහෙවර තුළ පොල් වගාව යටතේ අපනයන කෘෂි බෝග වගා කිරීමේ ශක්‍යතාවය අධ්‍යනය කිරීම අන්තර්ගත වුවත් භූමියේ පවතින පොල් ගස්වලින් වැඩි ප්‍රමාණයක අවු.50 ත් 84 ත් අතර වූ පැරණි පොල් ගස් වූයෙන් ආයතනයේ මෙහෙවරට අනුව ක්‍රියාකාරීත්වය හැඩගස්වා නොතිබුණි.

(ඉ) තක්සේරු වටිනාකම රු.3,000,000 ක් වූ වාහන 03 ක් වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ භාවිතයෙන් තොරව පැවතුණි.

(ඊ) තක්සේරු වටිනාකමෙහි එකතුව රු.4,850,000 ක වාහන 05 ක් වසර 2-4 ක් අතර කාලයක සිට නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව ප්‍රධාන කාර්යාලයේ හා මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ ගාල් කර තිබුණි.

(උ) දෙපාර්තමේන්තුව සතුව වාහන 98 ක් පැවතියද රියදුරන් 48 දෙනෙකු සේවයේ යොදවා තිබුණු බැවින් අදාළ වාහන ඵලදායීව උපයෝජනය කිරීමට නොහැකිව තිබුණි.

(ඌ) මාතලේ මධ්‍යම පැළ තවාන සඳහා 2021 වර්ෂයේදී රු.111,600 කට මිලදී ගත් ලීටර් 5000 වතුර ටැංකි 02 ක් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ අපේක්ෂිත අරමුණට යොදාගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(එ) දෙපාර්තමේන්තුව වාහන වලට අවශ්‍ය ටයර් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස එකතුව රු.2,416,265 ක ටයර් 50 ක් මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ඉන් රු.1,812,231 ක ටයර් 35 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි.

### 4.3. හානි පාඩු

(අ) මු.රෙ.104(1) ප්‍රකාරව රජයට සිදුවන හානි පාඩු සම්බන්ධයෙන් වහාම කටයුතු කර රජයට සිදු වූ හානි පාඩු අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් හානි පාඩු ප්‍රකාශය තුළ පැවති රු.3,037,216 ක ශේෂය තුළ පැවති වසර 1 ක් 10 ත් අතර කාලයක් තුළ සිදු වූ සිද්ධි 14 කට අදාළව රු.787,216 ක් කවදුරටත් අයවිය යුතුව පැවතුණි.

(ආ) මුල්හාල්කැලේ මධ්‍යම පැළ තවානේ රු. 470,745 ක ද්‍රව්‍ය ඌණතාවයක් පැවතියද ඒ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 4.4 කළමනාකරණ දුර්වලතා

(අ) 2011 සැප්තැම්බර් දින ඒ/28 380679 මගින් 10" x 12" කළු පොලිතින් බෑග් 100,000 ක් කුරුණෑගල සහකාර අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර විගණන දින වූ 2024 පෙබරවාරි 05 දින වන විටත් ඉන් බෑග් 53,350 ක් නිකුත් නොවූ ශේෂයක් ලෙස පැවතුණි. සැලසුමකින් තොරව අනවශ්‍ය ලෙස අමුද්‍රව්‍ය මිලදී ගැනීම හේතුවෙන් වසර 13 ක කාලයක් අනවශ්‍ය අයුරින් මුදල් අවුරා තැබීම සහ ඉණාත්මක බවින් ඉහළ භාණ්ඩ පරිභෝජනය කිරීමේ අවස්ථාව අහිමිකරගෙන තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් වසර 1 සිට 5 දක්වා කාල පරාසයකදී අයවිය යුතු එකතු වටිනාකම රු.451,079 ක ණය ශේෂයක් ද, සේවය අත්හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ වසර 1 සිට 20 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු.720,136 ක ණය ශේෂයක් 2024 දෙසැම්බර් 31 දින තෙක් අයකරගෙන නොතිබුණි.

(ඇ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අපනයන බෝග ව්‍යාප්තිය සඳහා බෝග පිළිබඳ පොත් මුද්‍රණය කර බෙදාහැරීමේ ක්‍රියාවලියක් සිදු කර තිබූ අතර එය ක්ෂේත්‍රගත කිරීම සඳහා 1996 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ විවිධ අවස්ථාවන් හිදී මුද්‍රණය කරන ලද රු.2,446,430 ක වටිනාකමින් යුත් පොත් 45,540 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඉතිරි වී පැවතුණි.

11

(ඇ) 2019 සිට 2023 දක්වා කාල පරිච්ඡේදයට අදාළව දෙපාර්තමේන්තුවේ පැළ තවාන් 12 ක නිෂ්පාදනය කළ හැකි උපරිම ධාරිතා මට්ටම පැළ 3,005,000 වු අතර. ක්ෂේත්‍රයට නිකුත් කළ පැළ ප්‍රමාණය 1,514,813 ක් විය. ඒ අනුව පැළ උපරිම ධාරිතාවයට සාපේක්ෂව ක්ෂේත්‍රයට පැළ නිකුත් කිරීම සියයට 50 ක් තරම් අඩු මට්ටමක පැවතුණි.

4.5. තිරසර සංවර්ධනය

2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව දක්වා තිබුණු අරමුණු අතරින් ආයතනයට අදාළව අරමුණු 05 ක් හඳුනාගෙන තිබුණද තිරසර සංවර්ධන ඉලක්ක වෙත ළඟා වීම මැන බැලීම සම්බන්ධව නිශ්චිත වැඩසටහන් හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්යය මණ්ඩලය හා තත්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 177 ක පුරප්පාඩු පවතින බවත් තනතුරු 10 ක් අතිරික්තව පවතින බවත් දක්වා තිබුණද අනුමත කාර්යමණ්ඩලය වර්තමාන කාර්යභාරය හා සමාලෝචනය කර සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| සේවා වර්ගය | අනුමත කාර්යය මණ්ඩලය | තත්‍ය කාර්යය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. ජ්‍යෙෂ්ඨ මට්ටම | 81 | 61 | 20 | - |
| ii. තෘතික මට්ටම | 29 | 08 | 21 | - |
| iii. ද්විතික මට්ටම | 770 | 679 | 101 | 10 |
| iv. ප්‍රාථමික මට්ටම | 34 | 289 | 35 | - |
| | 1,204 | 1,037 | 177 | 10 |

එම්.කේ.ඩී.එන්.මායාකඩුව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

# පරිච්ඡේදය 04

# කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

### 4.1.1. අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන

අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ 2024 වසර සඳහා මහා භාණ්ඩාගාරය මඟින් ලබා දුන් රු.මි. 400.00 ක ප්‍රතිපාදන වලින් වගා වපසරිය වැඩි කිරීම, මධ්‍යම පැළ තවාන් සංවර්ධනය, ඵලදායීතාවය ඉහළ නැංවීම, අගය එකතු කිරිමේ වැඩසටහන, සන්නිවේදන වැඩසටහන්, ධාරිතා වර්ධන වැඩසටහන, පරිපාලන වියදම් රු.මි. 368.0723 ක් සංවර්ධන වැඩසටහන් සඳහා වැය විය.

| වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | ඉලක්ක |
|---|---|---|
| වගා වපසරිය ඉහල නැංවීමේ වැඩසටහන | 192.82 | • නව වගා හෙක්ටයාර - 1731<br>• කුඩා පරිමාණ ගෙවතු පැළ -1,121,666<br>• පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන - පුවක් පැළ 1,662,200 |
| මධ්‍යම පැළ තවාන් සංවර්ධනය | 12.50 | • පුවක් බීජ මිලදී ගැනීම්- 136,500<br>• සාදික්කා බීජ මිලදී ගැනීම්- 12,390<br>• පාච්මන්ට් කෝපි - කි.ග්‍රෑම් 18.75<br>• 8''x5'' බෑග් මිලදී ගැනීම් - 900,000<br>• බඳුන් මාධ්‍ය - කියුබ් 275<br>• ගොවිපල උපකරණ මිලදී ගැනීම් - 161 |
| අපනයන කෘෂිභෝග ඵලදායිතාව ඉහල නැංවීමේ වැඩසටහන | 47.72 | • පාළු පැළ ලබාදීම- හෙක්ටයාර - 6082<br>• සත්ත්ව හානි වැලැක්වීම - ඒකක 32<br>• ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති - ඒකක 35<br>• දිලීර නාශක මිලදී ගැනීම් - කි.ග්‍රෑම් 1650<br>• පළිබෝධනාශක - ලීටර් 50<br>• ඉස්නා මිලදී ගැනීම් - 20 |
| අගය එකතු කිරීමේ වැඩසටහන | 43.80 | • GAP සහතික ලබා දීම් -50<br>• වැඩසටහන් - 05<br>• පසු අස්වනු තාක්ෂණික උපකරණ - ඒකක 150<br>• වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් - 03<br>• තත්ව සහතික ලබා දීම්- 04<br>• පාර්ශ්වකරුවන් ලියාපදිංචිය- 10,000<br>• දැනුවත් කිරීමේ වැඩමුළු - 05 |
| ජනමාධ්‍ය සහ සන්නිවේදනය | 20.00 | • රූපවාහිනී වැඩසටහන් -51<br>• ගුවන් විදුලි වැඩසටහන් - 102<br>• අනෙකුත් වැඩසටහන් - 52<br>• ප්‍රදර්ශන -10<br>• අත් පත්‍රිකා මුද්‍රණය - 500,000<br>• තාක්ෂණික ප්‍රකාශන - 30,000<br>• ඩිජිටල් මුද්‍රණ- 100<br>• පෝස්ටර්/ බැනර් - 25,000<br>• දැන්වීම් - 20 |

| | | |
|---|---|---|
| කුසලතා සංවර්ධනය | 8.00 | • ගොවි පුහුණු 1,730<br>• ක්ෂේත්‍ර දින 270<br>• ප්‍රතිලාභීන් - 40,000<br>• නිළධාරී පුහුණු වැඩසටහන් - 37<br>• අනෙකුත් පුහුණු වැඩසටහන්-10<br>• ගොවි පුහුණු වැඩසටහන් - 10<br>• සමුළු සහ වැඩමුළු - 08 |
| 2024 වසරේ කුරුඳු වගා සංවර්ධන වැඩසටහන | 63.16 | • කුරුඳු පැළ තවාන්කරුවන් සඳහා ගෙවීම්- කුරුඳු පැළ 3,508,825<br>• කුරුඳු පැළ බෙදා දීම් - හෙක්. 385 |
| පරිපාලන වියදම් | 12.00 | |
| මුළු ප්‍රතිපාදන ප්‍රමාණය | 400.00 | |

2024 වසරේදී දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද නව වගා සංවර්ධන වැඩසටහන යටතේ, ගම්මිරිස් හෙක්ටයාර 371.65 ක්, ඇරබිකා කෝපි හෙක්ටයාර 180.04 කොකෝවා හෙක්ටයාර 444.03ක් කොකෝවා - හෙක්ටයාර 109.93 කරාබු - 45.30 සාදික්කා - හෙක්ටයාර - 48.12 සිට්‍රොනෙල්ලා - හෙක්ටයාර 2.00 සේර - හෙක්ටයාර - 0.2 ගොරකා - හෙක්ටයාර - 1.40 කෝපි (ඇරබිකා) – හෙක්ටයාර 396.35, කෝපි (රොබස්ටා) - හෙක්ටයාර 58.05 කරදමුංගු හෙක්ටයාර 66.71 වැනිලා - හෙක්ටයාර 35.40, කහ - හෙක්ටයාර 56.23 ඉඟුරු - හෙක්ටයාර - 57.85 ක වගා වපසරියකනව වගාවන් සිදු කරන ලදී. 2024 වසරේදී සමස්ත ඉලක්ක ගත වගා වපසරිය වූ හෙක්ටයාර 1731 න් සම්පූර්ණ කරන ලද සමස්ත නව වගා වපසරිය හෙක්ටයාර 1321.59 ක ප්‍රමාණයක් විය. එය ඉලක්කගත වගා වපසරියෙන් 76.35% ක ප්‍රගතියක් අත් කර ගන්නා ලදි.

කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන යටතේ ගම්මිරිස් පැළ 380,727 ක්, කොකෝවා පැළ 15,182 ක්, කරාබු පැළ - 10,989 සාදික්කා පැළ -7,663 බුලත් පැළ - 56,826 , ලෙමන්ග්‍රාස් - 3,500 ගොරකා පැළ 16,080 ක් හා කෝපි පැළ (ඇරබිකා) 96,596 කෝපි (රොබස්ටා) – 77,035 වැනිලා දඬු - 124,053 කහ පැළ 665 ක් ඇතුළුව සමස්ත පැළ 529,091 ක් පැළ ලබා දෙන ලද අතර 2024 වසරේදී සමස්ත වැඩසටහන යටතේ ඉලක්කගත පැළ ප්‍රමාණය 899,775 ක් විය.

පරිසර සංරක්ෂණය යටතේ පුවක් වගා වැඩසටහන යටතේ තනි වගාවන්, අතුරු වගාවන්, මිශ්‍ර වගාවන් යටතේ පුවක් පැළ 1,532,525 ක් ලබා දෙන ලදී.

මධ්‍යම පැළ තවාන් සංවර්ධනයේදී පුවක් බීජ 12,390 සාදික්කා සහ කෝපි බීජ කි.ග්‍රෑම් 18.75 ක් මිලට ගෙන තවාන් වෙත පැළ නිෂ්පාදනය සඳහා ලබා දෙන ලදී.

පැළ තවාන් සඳහා පොලිතීන් බෑග් 900,000 ක් හා බඳුන් මාධ්‍ය කියුබ් 275 ක් ලබා දෙන ලද අතර, ගස්නාව ජල සම්පාදන පද්ධතිය ස්ථාපනය අවසන් කිරීමට හැකි වූ අතර, මිද්දෙණිය ගොවිපල තුල පැළ මඩුවක් සකස් කිරිම අවසන් කරන ලදි. එමෙන්ම ගොවිපල උපකරණ 161 ක් මධ්‍යම පැළ තවාන් සඳහා ලබා දෙන ලදී.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය වාර්ෂික පැළ අවශ්‍යතාවය, සෘජුවම පවත්වා ගෙන යන පැළ තවාන් 12ක් මඟින් හා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන් මඟින් සපුරා ගනු ලබයි. මධ්‍යම පැළ තවාන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපිරීම, රෝපණ ද්‍රව්‍ය හා රෝපණ මාධ්‍ය සැපයීමේ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලදී.

පවතින වගාවන්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ වගා ඒකක භූමි ප්‍රමාණයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීමට අපේක්ෂා කරන ලදී. 2024 වසරේදී ද මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, මේ යටතේ සමස්ත හෙක්ටයාර 4,105 ක් සඳහා පාළු පැළ ලබා දීමද, වන සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීම සඳහා පළිබෝධ පාලන ඒකක 13 ක් හා කාලගුණික වෙනස්කම් වලින් භෝගයන්ට වන හානි වලින් වගාවන් ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 50% ක පිරිවැය දරමින් ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ඒකක 18 ක් වගාකරුවන් වෙත සපයන ලදි. දිලීරනාශක කි.ග්‍රෑම් 1650ක්, කෘමිනාශක ලීටර් 50 ඉස්න යන්ත්‍ර 20 ක් ශාක ආරක්ෂණ වැඩසටහන යටතේ මිලදී ගනු ලැබිය.

- අගය දාම සංවර්ධන වැඩසටහන යටතේ පසු අස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය මඟින් පසු අස්වනු උපකරණ 144 ක් සඳහා ආධාර ලබාදෙන ලදී.
- අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත පාශ්වකරුවන් මෙන්ම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා සන්නිවේදන වැඩසටහන් රැසක් 2024 වසරේදී ක්‍රියාත්මක කරනු ලැබීය.
- ඒ යටතේ ගුවන් විදුලි, රූපවාහිනී වැඩසටහන්, මුද්‍රිත මාධ්‍ය, තොරතුරු කේන්ද්‍රය, 1920 කෘෂි සේවා තොරතුරු, වෙබ් අඩවි, facebook, You Tube, Telegram සහ Whatsapp වැනි සමාජ මාධ්‍ය ජාලා මඟින් ද අපනයන කෘෂි බෝග තොරතුරු පාර්ශ්වකරුවන් අතර සන්නිවේදනය කරන ලදී. තොරතුරු කේන්ද්‍රය, වෙබ් අඩවිය හා ප්‍රදර්ශන මඟින් අවශ්‍ය අපනයන කෘෂි බෝග තාක්ෂණික දැනුම ලබා දී ඇත.
- ධාරිතා වර්ධන වැඩසටහන යටතේ ගොවි පුහුණු, ක්ෂේත්‍ර දින, මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් හා අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනයන්හි මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50%- 74% |
| වගා කරන ලද නව වගා හෙක්ටයාර් ප්‍රමාණය | | 76.35 | - |
| කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන සඳහා නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව | | 79.33 | |
| පුවක් ප්‍රවර්ධන වැඩසටහන යටතේ නිකුත් කරන ලද පුවක් පැළ සංඛ්‍යාව | 92.19 | | |
| මධ්‍යම පැළ තවාන් සඳහා බඳුන් මාධ්‍ය හා බීජ මිලදී ගැනීම | | | 55.57 |
| මධ්‍යම පැළ තවාන් සඳහා පොලිතීන් බෑග් මිලදී ගැනීම් | 90.83 | | |
| මධ්‍යම පැළ තවාන් ගෘහ හා ජල සම්පාදන පද්ධති පිහිටුවීම | 100 | | |
| ගොවිපල සඳහා අවශ්‍ය යෙදවුම් මිලදී ගැනීම්(ගොවිපල උපකරණ, රසායනික පොහොර) | | | 53.67 |
| පාළු පැළ සිටුවීම මඟින් ඵලදායිතාවය ඉහළ නංවන ලද ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) | | | 67.51 |
| ස්ථාපිත කරන ලද සත්ව හානි වැටවල් ප්‍රමාණය | | | 40.62 |
| ස්ථාපිත කරන ලද ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධති ප්‍රමාණය | | | 51.42 |
| ශාක ආරක්ෂණ වැඩසටහන(රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම්) | | 75 | |
| බෙදා හරින ලද පසු අස්වනු තාක්ෂණ උපකරණ ප්‍රමාණය | 117 | | |
| සන්නිවේදන | 96.79 | | |
| ගොවි පුහුණු | 122.40 | | |
| ක්ෂේත්‍ර දින වැඩසටහන් | 135 | | |
| සේවාස්ථ පුහුණු වැඩසටහන් | | | 72.5 |

මාතලේ අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය විසින් 2024 වසරේ බෝග ආරක්ෂණය, බෝග සහ තවාන් කළමණාකරණය පිළිබඳ ගොවි දින පිළිබඳ පුහුණු වැඩසටහන් 18 ක් හරහා ගොවීන්, වතු හිමියන් සහ නිලධාරින් වැනි අපනයන කෘෂි පාර්ශවකරුවන් 900ක් පමණ පුහුණු කරන ලදි. ඊට අමතරව ගොවීන් , ව්‍යාප්ති සහ ක්ෂේත්‍ර නිලධාරීන් 275 දෙනෙකු කෘෂි සංචාරක ව්‍යාපාරය සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබා ඇත. මාතලේ අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයෙහි පසු අස්වනු තාක්ෂණ අංශය සිසුන්, ගොවීන්, "විදාතා" නිලධාරින් සහ ව්‍යවසායකයින් ඇතුළු සහභාගීවන්නන් 321 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 9ක් පවත්වන ලදි. නාරම්මල බුලත් සහ අතුරු වගා පර්යේෂණ මධ්‍යස්ථානයේ දී, බුලත් වගාව සහ පොල් වගාව යටතේ අතුරු බෝග වගාව පිළිබඳ වැඩසටහන් 34ක් හරහා ගොවීන් 989 දෙනෙකු පුහුණු කරන ලදී. කුණ්ඩසාලේ උප පර්යේෂණ මධ්‍යස්ථානයේ වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානයේ පෞද්ගලික අංශයේ සේවකයින්, නිලධාරින්, කම්කරුවන් සහ සිසුන් වැනි පාර්ශවකරුවන් 50 දෙනෙකු පමණ තවාන් කළමණාකරණය පිළිබඳ පුහුණුව ලබා ඇත. පර්යේෂණ අංශයේ නිලධාරින් විවිධ විෂයන් පිළිබඳ පවත්වන ලද බොහෝ Zoom තාක්ෂණය ඔස්සේ පැවති වැඩසටහන් සඳහා සම්පත්දායකයින් වූ අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද බොහෝ ජනමාධ්‍ය වැඩසටහන් සඳහා ද සහභාගී වී ඇත.

2024 වසරේ දී පාසල් ළමුන් 600ක් NVQ 3 මට්ටමේ සිසුන් 450ක්, කෘෂිකාර්මික පාසල්වල සිසුන් 280 ක් විවිධ රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාලවලින් උපාධි අපේක්ෂකයින් 1200ක් පමණ මාතලේ අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයට පැමිණ අපනයන කෘෂි බෝග රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, බෝග කළමණාකරණ පිළිවෙත්, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු ලබා ඇත. NVQ 3,4,5,6,7 සහ 8 මට්ටමේ සිසුන් 81ක් පමණ ඔවුන්ගේ විෂය මාලාවේ අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස මාතලේ අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ දී ඔවුන්ගේ කාර්මික පුහුණුව සම්පූර්ණ කළහ. ඒ හා සමානව නාරම්මල බුලත් සහ අතුරු වගා පර්යේෂණ ස්ථානයෙහි සිසුන් 10 දෙනෙකු සහ වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානයෙහි සිසුන් 02 දෙනෙකු ඔවුන්ගේ කාර්මික පුහුණුව ලබා ගත්හ.

වල්පිට පටක රෝපණ පර්යේෂණ මධ්‍යස්ථානය අලෙවිය සඳහා පටක රෝපිත වැනිලා සහ එනසාල් පැළ සාර්ථකව නිෂ්පාදනය කරන ලදි. ගුණාත්මක ශාක නිෂ්පාදනය සඳහා වඩා හොඳ රෝපණ ද්‍රව්‍ය සොයා ගැනීම සඳහා වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානයේ එක් එක් අපනයන කෘෂිකාර්මික බෝග සඳහා මව් ශාක උද්‍යාන පවත්වාගෙන යනු ලැබේ. අලෙවිය සඳහා බුලත් සහ කෝපි පැළ වැඩි කිරීම අරමුණු කර ගනිමින් බුලත් සහ කෝපි ක්ෂේත්‍ර ද සාර්ථකව නඩත්තු කරන ලදි. රුපියල් මිලියන 2.8 ක් පමණ වටිනා ගම්මිරිස්, කුරුඳු, එනසාල්, කරාබු නැටි, සාදික්කා, පුවක්, පඳුරු ගම්මිරිස්, කහ සහ වැනිලා රෝපණ ද්‍රව්‍ය 76,800ක් පමණ අලෙවි කරන ලද අතර අනෙකුත් අරමුණු සඳහා රෝපණ ද්‍රව්‍ය 52,000 ක් පමණ නිකුත් කරන ලදි. මාතලේ අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ පැළ තවාන විවිධ අපනයන කෘෂි භෝග රෝපණ ද්‍රව්‍ය 6000ක් පමණ නිෂ්පාදනය කර ඇත. අතුරු වගා සහ බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය විසින් බුලත් මුදුන් කැබලි 1600ක් සහ ගම්මිරිස් මුදුන් කැබලි 1200ක් පමණ ගොවීන් අතර බෙදා දෙන ලදි. කුණ්ඩසාලේ උප පර්යේෂණ මධ්‍යස්ථානයේ ගම්මිරිස්, කෝපි,පුවක්, කහ, පැඟිරි බෝග සහ කිතුල් රෝපණ ද්‍රව්‍ය 17,800ක් පමණ නිෂ්පාදනය කරන ලදී.

මාතලේ අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයෙහි පාංශු විද්‍යා අංශය, පර්යේෂණ සඳහා මෙන්ම අපනයන කෘෂි පාර්ශවකරුවන්ගේ ඉල්ලීම මත පෙර පැවති තෙත පස් විශ්ලේෂණ තාක්ෂණය භාවිතයෙන් පාංශු පරීක්ෂණ සාම්පල 2500ක් පමණ විශ්ලේෂණය කිරීමෙන් පාංශු පරීක්ෂණ සේවා සපයා ඇති අතර 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 0.23 ක් පමණ උපයා ඇත.එසේම GCF ව්‍යාපෘතිය මඟින් ඉල්ලා ඇති වියළි පස් විශ්ලේෂණ ක්‍රමය මඟින් පස් සාම්පලවල් 1200 ක පමණ විශ්ලේෂණ පිටපත් පිළියෙළ කරන ලදි. මාතලේ අපනයන කෘෂි බෝග පර්යේෂණ මධ්‍යස්ථානයෙහි පසු අස්වනු අංශය මඟින් ද පාර්ශවකරුවන් සඳහා අපනයන කෘෂි බෝග නිෂ්පාදන පිළිබඳ ගුණාත්මක පරීක්ෂණ 70ක් පමණ නිකුත් කර ඇත. බෝග ආරක්ෂණ අංශය මඟින් පළිබෝධ සහ රෝග විනිශ්චය පිළිබඳ පරීක්ෂණ ප්‍රතිඵල ලබා දී ඇත. ඊට අමතරව පර්යේෂණ අංශයේ සියලුම පර්යේෂණ ස්ථාන මඟින් ගොවීන් හෝ ව්‍යවසායකයින් සඳහා උපදේශන සේවා සෘජුව මෙන්ම දුරකථන මාර්ගයෙන් සිදු කරන ලදි. අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ ජාතික කුළුබඩු උද්‍යානය, අපනයන කෘෂි බෝග සහ පාරිසරික සංචාරක කර්මාන්තය පිළිබඳ පාසල්, කාර්මික විද්‍යාල, විශ්වවිද්‍යාල, හෝටල් පාසල්,

ළමා හා කාන්තා සංවිධාන නියෝජනය කරමින් පැමිණි කණ්ඩායම් 122 ට පමණ දැනුම සහ විනෝදාස්වාදය ලබා දීමට කැපී පෙනෙන සේවාවක් සිදු කෙරිණි. ඊට අමතරව සංචාරය පිණිස එම ස්ථානයට 2024 වසරේ පමණක් දේශීය සංචාරකයින් 72 ක් සහ විදේශීය සංචාරකයින් 1181 ක් පැමිණ ඇති අතර කුළුබඩු නිෂ්පාදනයෙන් ජාතික කුළුබඩු උද්‍යානයේ අලෙවි සැල ලංකා රුපියල් මිලියන 0.9 ක ආදායමක් උපයා ඇත.

කැගල්ල, මාතලේ, කුරුණෑගල, පුත්තලම, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක වල ගම්මිරිස් බෝගයේ GAP සහතික කිරීමේ විගණන වැඩසටහනට පර්යේෂණ අංශයේ නිලධාරීන් සහභාගී වූ අතර කැගල්ලේ කෝපි සහ කොකෝවා සඳහා GAP සහතික කිරීමේ විගණන වැඩසටහන ට ද සහභාගී විය. පර්යේෂණ අංශයේ විද්‍යාත්මක සේවා නිලධාරිහු ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කරන ලද දකුණු ආසියාවේ තිරසාර දේශගුණය සහ ආපදා අවධානමට ඔරොත්තු දෙන සහ අඩු කාබන් සංවර්ධනය පිළිබඳ තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම, දේශගුණික විපර්යාස අනුවර්තනය පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව, දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය සහ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීමේ ජාතික කමිටුව සහ ජාතික පොහොර උපදේශක කමිටුව වැනි ජාතික කමිටු සහ ක්‍රියාකාරී කණ්ඩායම් නියෝජනය කළහ.

### 4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම්, අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම්.

අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන හා අපනයන කෘෂි බෝග පර්යේෂණ සහ ඒකාබද්ධ රෝග හා පළිබෝධ කළමණාකරණ (IPM) වැඩසටහන යන වැඩසටහන් 02 යටතේ ගොඩනැඟිලි අළුත්වැඩියා, යටිතල පහසුකම් සංවර්ධනය, ඉඩම් හා ඉඩම් සංවර්ධනය හා නව ඉදි කිරීම් සඳහා රුපියල් මිලියන 71ක ප්‍රතිපාදන 2024 වසර සඳහා වෙන් කරන ලදි. වෙන් වූ ප්‍රතිපාදන සඳහා අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ඒ යටතේ අපේක්ෂිත නිමැවුම 100% මට්ටමට ළඟා වීමට හැකි විය.

ඒ අනුව දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික්ක 17ක් තුළ හා පර්යේෂණ මධ්‍යස්ථාන 07 ක් තුළ අත්‍යවශ්‍ය හා හඳුනාගත් ව්‍යාපෘතින් ඒ ඒ වැය විෂයන් යටතේ පහත අයුරින් ක්‍රියාත්මක කරන ලදී.

| වැය විෂය | දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ගණන | පර්යේෂණ මධ්‍යස්ථාන තුළ ක්‍රියාතමක කරන ලද ව්‍යාපෘති ගණන |
|---|---|---|
| 289-02-01-2001 | 20 | 16 |
| 289-02-01-2104 | 03 | 01 |
| 289-02-01-2105 | 06 | 02 |
| 289-02-01-2506 | 09 | 09 |

ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින් වල නිමැවුම පහත පරිදි වේ.

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50%- 74% |
| ගොඩනැඟිලි අළුත්වැඩියාවන් සම්පූර්ණ කළ ප්‍රමාණය | 100 | | |
| සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රමාණය | 100 | | |
| ඉඩම් හා ඉඩම් සංවර්ධනය යටතේ සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ප්‍රමාණය | 100 | | |
| ඉදි කරන ලද නව ව්‍යාපෘති ප්‍රමාණය | 100 | | |

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. දෙපාර්තමේන්තුවට අදාලව හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු.

| දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන තිරසාර සංවර්ධන අරමුණු | ඉලක්ක | දර්ශකයන්ට අනුව ලබා ගත් ජයග්‍රහණ | ජයග්‍රහණ ලබා ගත් ප්‍රතිශතයන් | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100 |
| 2.4.1.1. ඵලදායී හා තිරසාර කෘෂි කර්මාන්තය යටතේ අපනයන කෘෂි වගාවන්ගෙන් ආවරණය වන භූමි ප්‍රමාණය | නව වගා වැඩසටහන | 1321.59 හෙක් | | | 76.35 |
| | කුඩා පරිමාණයේ ගෙවතු වගා වැඩසටහන (පැළ ලබා දීම) 1,121,666 ක පැළ | 899,770 පැළ | | | 79.33 |
| | පුවක් ප්‍රවර්ධන වැඩසටහන පුවක් පැළ 1,662,200 | පුවක් පැළ 1,532,525 | | | 92.19 |
| | බීජ හා රෝපණ ද්‍රව්‍ය මිල දී ගැනීම් පුවක් බීජ - 150,000 සාදික්කා -33,000 එනසාල් - කි.ග්‍රෑම් - 50කෝපි කි.ග්‍රෑම් - 20 | පුවක් බීජ-136,500 සාදික්කා - 12,390 එනසාල් සහ කෝපි බීජ කි.ග්‍රෑම් -18.75 | | 55.57 | |
| | මධ්‍යම පැළ තවාන් සඳහා යෙදවුම් මිල දී ගැනීම් පොලිතීන් බෑග් (8''x5'') 1,000,000 බඳුන් මාධ්‍ය - කියුබ් -300 | පොලිතීන් බෑග් (8''x5'') – 900,000 බඳුන් මාධ්‍ය - කියුබ් -275 | | | 90.83 |
| | රූපවාහිනී වැඩසටහන් - 51 ගුවන් විදුලි වැඩසටහන් - 102 අනෙකුත් වැඩසටහන් - 52 ප්‍රදර්ශන -10 අත් පත්‍රිකා - 500,000 තාක්ෂණික ප්‍රකාශන - 30,000 ඩිජිටල් මුද්‍රණ - 100 පෝස්ටර් / බැනර් - 25,000 දැන්වීම් -20 | රූපවාහිනී වැඩසටහන් - 51 ගුවන් විදුලි වැඩසටහන් 111 ප්‍රදර්ශන -08 අත් පත්‍රිකා -500 ඩිජිටල් මුද්‍රණ - 100 පෝස්ටර් / බැනර් -197 දැන්වීම් -03 | 43.47 | | |
| | ගොවි පුහුණු වැඩසටහන් - 1730 ක්ෂේත්‍ර දින වැඩසටහන් -270 ප්‍රතිලාභීන් - 40,000 | ගොවි පුහුණු වැඩසටහන්- 2230 ක්ෂේත්‍ර දින වැඩසටහන්- 234 ප්‍රතිලාභීන් -56,161 | | | 89.21 |
| 17.11.1.1. විදේශීය වෙළෙඳපොල සඳහා වන දේශීය දායකත්වයේ කෘෂි අංශයෙන් අපනයන කෘෂිකර්ම අංශයේ කොටස | තත්ත්ව සහතික - 50 වැඩසටහන් - 05 | තත්ත්ව සහතික -03 වැඩසටහන් - 03 | 33 | | |
| | පසු අස්වනු තාක්ෂණ උපකරණ - 150 | පසු අස්වනු තාක්ෂණ උපකරණ - 144 | | | 97.33 |
| | ගුණාත්මක තත්ත්ව සහතික -04 | ගුණාත්මක තත්ත්ව සහතික- 02 | | 50 | |
| | ව්‍යවසායකත්ව සහ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් | දැනුවත් කිරීමේ වැඩසටහන් -02 | 40 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දැනුවත් කිරීමේ වැඩසටහන් - 05 | | | | |
| 2.5.1.1.මධ්‍ය කාලීන හෝ දිගු කාලීන සංරක්ෂණ පහසුකම් වල සුරක්ෂිත කර ඇති අපනයනය කළ හැකි කෘෂිකාර්මික බෝග ජාන සම්පත් ගණන | කුරුඳු - 01<br>ගම්මිරිස් - 02කෝපි - 02<br>එනසාල් -02<br>වැනිලා - 02<br>සාදික්කා - 01<br>බුලත් -01<br>සහ කහ 01 ලෙස පර්යේෂණ 12 ක් සිදු කරන ලදි. | සොයාගැනීම් 08 | | 66 | |
| 9.5.2. අඛණ්ඩව සිදුවෙමින් පවතින නවෝත්පාදන සහ පර්යේෂණ | පර්යේෂණ ගණන - 128<br>අඛණ්ඩ පර්යේෂණ- 115 | නවෝත්පාදන/නිර්දේශ / සොයාගැනීම් - 98 | | | 76 |

## 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමේදී ඵලදායි හා තිරසාර කෘෂිකර්මාන්තය අරමුණු කර ගනිමින් 2024 වසර තුළ දීද අපනයන කෘෂි බෝග වගාවන් ස්ථාපනය කරන ලදි. අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය තුලින් අපනයන භෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ ආදායම ඉහළ නැංවීම හා ආර්ථිකය ඉහළ නංවාලීමේ අරමුණින් යුතුව හෙක්ටයාර 1321.59 වපසරියක් තුල නව වගාවන් ආරම්භ කිරිමට හැකි වූ අතර, වගාවන්ට සිදුවන කාලගුණික හා දේශගුණික තත්වයන් හා රෝග හා පළිබෝධ මඟින් සිදුවන හානි සහ වගාකරුවන් නව වගාවන් ලෙස අළුතින් ආරම්භ කිරීම සඳහා පිරිවැය වැඩිවීම වැනි හේතු මත වගාකරුවන්ගේ උනන්දුව අඩුවීම මෙහි ප්‍රධාන අභියෝගයක් විය.

ගෘහස්ථ ඒකකය තුල ආහාර සුරක්ෂිතතාව ඇතිකිරීම මඟින් ජනතාවගේ කුළුබඩු අවශ්‍යතාවය ගෙවතු තුලින් ලබා ගෙන වස විසෙන් තොර ආහාර ලබා ගැනිමේ අරමුණින් යුතුව අපනයන කෘෂිබෝග කුඩා පරිමාණ ගෙවතුවගා ස්ථාපනය කිරිම සිදු කරන ලදී. මෙම වැඩසටහන යටතේ ගම්මිරිස්, කොකෝවා, කරාබු, සාදික්කා, බුලත්, ලෙමන්ග්‍රාස්, ගොරකා සහ කෝපි, එනසාල්, වැනිලා, කහ පැළ ඇතුළු අපනයන කෘෂි බෝග පැළ 899,775 ක් ලබා දිමට හැකි විය. ගෙවතු වැඩසටහන සඳහා ලබා දුන් අපනයන කෘෂි බෝග පැළ සඳහා ගොවීන්ගේ ඉල්ලුම අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පැවැතීම හේතුවෙන් ගෙවතු වගාවේ අපේක්ෂිත පැළ ඉලක්ක ලබා දීමට නොහැකි වීම අභියෝගයක් විය.

පරිසර සංරක්ෂණය, තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ ප්‍රධාන අංගයක් ලෙස සලකන අතර එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වාරිමාර්ග හා ඇළ වේලි දෙපස පුවක් වගාව ව්‍යාප්ත කිරිමේ වැඩසටහන 2024 වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පුවක් පැළ 1,532,525 ක් ගොවීන් වෙත නිකුත් කර ඇත. වැට මායිම් සහ ගෙවතු වගාවන් සඳහා පුවක් පැළ ඉල්ලුම පැවැතියද පුවක් තනි වගාවන් ලෙස පැවැති ඉල්ලුම අවම වීම පුවක් වගාව ප්‍රචලිත කිරිම අභියෝගයක් විය.

තිරසාර ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තහවුරු කිරීම සඳහා අපනයන බෝග වගාවන්හි ඵලදාව ඉහළ නංවාලීමේ වැඩසටහන 2024 වසරේ දී ක්‍රියාවට නංවන ලදී. මෙම වැඩසටහන යටතේ වගාවන්ගේ පවතින පාළු සම්පූර්ණ කිරීම සඳහා පාළු පැළ ලබා දෙන ලදී. එහෙත් ඉලක්ක ගත පාළු පැළ සඳහා ගොවීන්ගෙන් පැවැති ඉල්ලුම අවම වීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා යාමට නොහැකි වීම අභියෝගයක් විය. තවද, වගාවන්ට ස්වාභාවිකව සිදුවන නියං හානි වළක්වා ගැනීම සඳහා විසුරුම් ජල පද්ධති / බිංදු ජල සම්පාදන පද්ධති හා පළිබෝධ පාලන ඒකක සඳහා වැයවන වියදමින් 50% ආයෝජන ආධාර මුදල් ලබා දෙන ලදී. මේ යටතේ පළිබෝධ පාලන ඒකක 13 ක් සහ ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති 18 ක් ස්ථාපනය වෙනුවෙන් ආයෝජන ආධාර ලබා දෙන ලදී. එහෙත් මෙම ඵලදායීතා වර්ධන වැඩසටහන සඳහා ගොවීන් යොමු වීමේ අඩු ප්‍රවණතාවය හේතුවෙන් මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේ අභියෝගයක් විය.

නීරෝගීමත් ජනතාවක් බිහි කරලීම සඳහා 2024 වසරේදී කාබනික ගම්මාන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. එම වැඩසටහන තුළින් වස විසෙන් තොර ගුණාත්මක අපනයන කෘෂි බෝග නිෂ්පාදන කරා ගොවීන් යොමු කරවීමේ අරමුණින් යුතුව කාබනික වගාවන් පොකුරු ගොවිපල පද්ධතියක් ලෙස කාබනික සහතිකකරණ වැඩසටහනට සම්බන්ධ කරන ලදී. අපනයන කෘෂිකර්ම අගය දාම සංවර්ධන වැඩසටහන යටතේ අපනයන කෘෂි බෝග කාබනික වගාවන් ලෙස පිහිටුවීමේ වැඩසටහන මඟින් ජාත්‍යන්තර කාබනික සහතික 03 ක් ලබා දෙන ලදී. එහෙත් අපනයන කෘෂි බෝග වගාවන් කාබනික වගාවන් ලෙස පවත්වාගෙන යනු ලබන ඉඩම් ප්‍රමාණය සීමා වීම හේතුවෙන් කාබනික ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අභියෝගයක් විය.

පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ මහා පරිමාණ සැකසුම්කරුවන් අනෙකුත් අපනයනකරුවන් හා සම්බන්ධ කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කළද ඒ සඳහා වැඩි උනන්දුවක් මෙන්ම ලියාපදිංචි කිරීම හේතුවෙන් ඔවුන් වෙත ප්‍රතිලාභයන් නොලැබීම හේතුවෙන් ඒ සඳහා වැඩි උනන්දුවක් නොදැක්වීම හේතුවෙන් පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම දෙපාර්තමේන්තුව වෙත අභියෝගාත්මක කාර්යයක් විය.

# 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු (අතිරික්ත )** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 81 | 63 | 28 |
| තෘතීයික | 29 | 08 | 21 |
| ද්විතියික | 770 | 685 | 85 |
| ප්‍රාථමික | 324 | 296 | 28 |
| රා. ප.ව.25/204 අනුව ස්ථිර කරන ලද කොන්ත්‍රාත් තනතුරු | - | 105 | - |
| එකතුව | 1204 | 1157 | 162 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා විද්‍යාත්මක ශ්‍රේණියේ හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු අපනයන කෘෂි භෝග පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු කාර්යක්ෂමව සිදුකරගෙන යාමට බාධාවක්ව පවතී.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (Rs 000 ) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශිය | විදේශීය | | |
| ශ්‍රී ලාංකේය කෝපි කර්මාන්තය ඉහළ නැංවීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු වැඩසටහන | 27 | දින 02 | 73318.50 | | දේශීය | කෝපි කර්මාන්තය ඉහළ නැංවීම පිළිබඳ දැනුම |
| නවක ව්‍යාප්ත නිලධාරීන් , ගොවිපල කළමනාකරුවන් සහ තාක්ෂණ නිලධාරීන් සඳහා පූර්ව සේවා සේවාස්ථ පුහුණු වැඩසටහන | 23 | දින 05 | 148905.70 | | දේශීය | නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ක්ෂේත්‍රගත නවක සංවර්ධන නිලධාරීන් සඳහා අපනයන කෘෂිකර්ම බෝග පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 17 | දින 03 | 53681.30 | | දේශීය | අපනයන කෘෂිකර්ම බෝග පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම |
| (GCF)නකල්ස් ව්‍යපෘති වැඩසටහන | 43 | දින 02 | 143267.08 | | දේශීය | අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම |
| ක්ෂේත්‍රගත නවක සංවර්ධන නිලධාරීන්තාක්ෂණ නිලධාරීන් සඳහා පූර්ව සේවා සේවාස්ථාන පුහුණු වැඩසටහන -1 | 8 | දින 04 | 46378.00 | | දේශීය | නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව |
| ක්ෂේත්‍රගත නවක සංවර්ධන නිලධාරීන්තාක්ෂණ නිලධාරීන් සඳහා පූර්ව සේවා සේවාස්ථාන පුහුණු වැඩසටහන -1 | 8 | දින 04 | 46378.00 | | දේශීය | නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව |
| ක්ෂේත්‍රගත නවක සංවර්ධන නිලධාරීන් තාක්ෂණ නිලධාරීන් සඳහා පූර්ව සේවා සේවාස්ථ පුහුණු වැඩසටහන-11 | 33 | දින 05 | 158526.90 | | දේශීය | නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව |
| ව්‍යාප්ති නිලධාරීන් හා ක්ෂේත්‍රගත සංවර්ධන නිලධාරීන් සඳහා පවත්වනු ලබන වැනිලා වගාව හා වැනිලා මල් පරාගනය සම්බන්ධ පුහුණු වැඩසටහන | 25 | දින 01 | 25713.00 | | දේශීය | වැනිලා වගාව හා වැනිලා මල් පරාගනය සම්බන්ධ දැනුම |
| ක්ෂේත්‍රගත සංවර්ධන නිලධාරීන් සඳහා පවත්වනු ලබන වැනිලා වගාව හා වැනිලා මල් පරාගනය සම්බන්ධ පුහුණු වැඩසටහන | 32 | දින 01 | 24680.84 | | දේශීය | වැනිලා වගාව හා වැනිලා මල් පරාගනය සම්බන්ධ දැනුම |
| වැනිලා මල් පරාගනය සම්බන්ධ ගොවි පුහුණු වැඩසටහන | 40 | දින 01 | 29421.70 | | දේශීය | වැනිලා මල් පරාගනය පිළිබඳ දැනුම |
| පර්යේෂණ හා ව්‍යාප්ති සංවාදය | 56 | දින 01 | 57411.00 | | දේශීය | නව පර්යේෂණ ප්‍රවණතා හඳුනා ගැනීම |
| පස හා පාංශු සංරක්ෂණය පිළිබඳ දෙපාර්තමේන්තු පුහුණු වැඩසටහන | 45 | දින 01 | 29809.50 | | දේශීය | පස හා පාංශු සංරක්ෂණය පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නවක සහකාර අධ්‍යක්ෂ නේවාසික පුහුණුව | 7 | දින 05 | 65624.00 | | දේශීය | නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව |
| වාහන පරිපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන | 46 | දින 01 | 46622.60 | | දේශීය | වාහන පරිපාලනය පිළිබඳ දැනුම |
| වර්ධක ප්‍රචාරණ ක්‍රම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 23 | දින 02 | 42636.20 | | දේශීය | වර්ධක ප්‍රචාරණ ක්‍රම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පිළිබඳ දැනුම |
| කළමනාකරණ සේවා නිලධාරී හා සංවර්ධන නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය හා ගිණුම් ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 38 | දින 02 | 72574.80 | | දේශීය | ආයතන සංග්‍රහය හා ගිණුම් ක්‍රම පිළිබඳ දැනුම |
| පාංශු සංරක්ෂණය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු පුහුණු වැඩසටහන | 40 | දින 02 | 56540.00 | | දේශීය | පස හා පාංශු සංරක්ෂණය පිළිබඳ දැනුම |
| නාරම්මල, ලුණුවිල පොල් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | දින 02 | 5000.00 | | දේශීය | පොල් සංවර්ධනය පිළිබඳ දැනුම |
| රාජ්‍ය වැටුප් සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 02 | 36000.00 | | දේශීය | රාජ්‍ය වැටුප් සැකසීම පිළිබඳ දැනුම |
| ප්‍රාථමික සේවා ගණයේ නිලධාරීන් සඳහා රාජ්‍ය සේවය තනතුරේ වගකීම හා ආකල්ප සංවර්ධනය සඳහා එක් දින පුහුණු වැඩසටහන | 273 | දින 01 බැගින් කණ්ඩායම් 05 | 313730.50 | | දේශීය | රාජ්‍ය සේවය පිළිබඳ මනා අවබෝධයක් ඇති කිරිම,තම තනතුරේ වගකීම පිළිබඳ අවබෝධය ඇති කිරිම, ධනාත්මක ආකල්ප සංවර්ධනය |

### ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන්පැහැදිලි කරන්න.

මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරෙන අපනයන භෝග පර්යේෂණ සහ ව්‍යාප්ති ක්‍රම, අගය දාම කළමනාකරණය, අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධව යාවත්කාලීන වූ දැනුම සහ අන්තර්ජාතික වශයෙන් තරඟකාරීත්වයකදී අප නිපැයුම් සඳහා ප්‍රමාණතාවන් ලබා ගැනීමට ද ඒ සම්බන්ධ වූ විශේෂිත දැනුම අත්‍යාවශ්‍ය වේ.

ඒ ඒ බෝග පිළිබඳ අදාල දැනුම පුහුණු වැඩසටහන්වලදී ලබා දේ. ඒ අනුව ලබා ගත් දැනුම ඍජුවම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි සංවර්ධන/ පර්යේෂණ වැඩසටහන්වල ඉලක්ක ළඟා කර ගැනීමට ඉවහල් විය.

තවද, ඒ ඒ තනතුරු දරන්නන් විසින් දැරිය යුතු ආයතනික පරිපාලනමය වගකීම නිසි පරිදි ඉටු කිරීමට, අඛණ්ඩ පුහුණුව අවශ්‍ය වේ. එමඟින් ආයතනයේ පරිපාලනය, නිසි පරිදි කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට ද ඉවහල් විය.

# 07 පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | අනුකූල වේ. | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම(වාණිජ අත්තිකාරම් ගිණුම) | | අදාළ නැත. | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | අදාළ නැත. | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | අදාළ නැත. | |
| 1.6 | වෙනත් | | අදාළ නැත. | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරිම(මු.රෙ.445)/ | අනුකූල වේ. | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරිම | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 03 | මූල්‍ය පාලනය සඳහා කාර්යන්අභිනියෝජනය කිරිම (මු.රෙ.135) | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 4 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය ඇස්තමේන්තුවට (NB D) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 5 | විගණන විමසුම් | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගනන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 6 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ.134(2)DMA/l-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මු.රෙ.134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |

| | | | | |
|---|---|---|---|---|
| 7.1 | DMA චක්‍රලේඛ1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ. | 2024 වර්ෂයේ සිව්වන කාර්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතිණි. ඒ හේතුවෙන් සිව්වන විගණන කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි විය. | 2025 ජනවාරි මස සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරෙහි පවතින පුරප්පාඩුව පූර්ණය වී ඇති බැවින් 2025 වර්ෂයේ සිට විගණන හා කළමණාකරණ කමිටු 04 නිසි පරිදි පැවැත්වීමට හැකියාව ඇත. |
| 8 | වත්කම් කළමණාකරණය | | | |
| 8.1 | අංක 01 /201.7 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව, වත්කම් මිළදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරනය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛය සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කොට තිබීම | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොක් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල අයිතිය පවරා ගැනීම | අනුකූල නොවේ | කල්බදු පදනම මත ලබා ගත් වාහනවල කාලසීමාව අවසන් වූ පසු දෙපාර්තමේන්තුවට නැවත සමුපූර්ණ පවරා ගැනීම සිදු නොකරයි. | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | | අක්‍රිය බැංකු ගිණුම් නොමැත. | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | අනුකූල වේ. | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්ම වන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | | |
| 12 | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ. | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 13 | පොදු තැන්පතු ගිණුම | අනුකූල වේ. | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | අග්‍රිම ගිණුම | අනුකූල වේ. | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කාර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| 15 | ආදායම් ගිණුම | අනුකූල වේ. | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රෙල්ඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේ-න්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍රෙල්ඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල නොවේ. | 2024.01.10 BD/CBP/01/01/01-2024 අංක දරණ අයවැය චක්‍ර ලේඛ අංක 1/2024 යි 05 (5.1) ඡේදය අනුව පුහුණු කටයුතු සීමා කිරීමට සිදු විය. | |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ. | | |
| 20 | විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |

ඇමුණුම 01- අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව - 2024

| නිෂ්පාදනය | ඒකකය | | ආනයන | අපනයන |
|---|---|---|---|---|
| කුරුඳු | පරිමාව | මෙට්‍රික් ටොන් | 27.58 | 19,546.16 |
| | වටිනාකම | රු. මි | 111.87 | 65,452.01 |
| කුරුඳු කොළ (චියළි) | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.00 | 124.36 |
| | වටිනාකම | රු. මි | 0.02 | 29.54 |
| කුරුඳු කොළ තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.01 | 241.21 |
| | වටිනාකම | රු. මි | 0.01 | 1263.31 |
| කුරුඳු පොතු තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.23 | 21.13 |
| | වටිනාකම | රු. මි | 0.77 | 1237.55 |
| කරාබු | පරිමාව | මෙට්‍රික් ටොන් | 14.84 | 894.13 |
| | වටිනාකම | රු. මි | 70.60 | 3618.54 |
| කරාබු නැටි | පරිමාව | මෙට්‍රික් ටොන් | | 162.65 |
| | වටිනාකම | රු. මි | | 162.70 |
| කරාබු තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 2.27 | 13.62 |
| | වටිනාකම | රු. මි | 21.78 | 220.98 |
| කොකෝවා | පරිමාව | මෙට්‍රික් ටොන් | 7,055.53 | 2653.36 |
| | වටිනාකම | රු. මි | 13,415.60 | 7648.71 |
| කෝපි | පරිමාව | මෙට්‍රික් ටොන් | 394.64 | 44.84 |
| | වටිනාකම | රු. මි | 1,408.27 | 176.02 |
| ගම්මිරිස් | පරිමාව | මෙට්‍රික් ටොන් | 20.92 | 25978.35 |
| | වටිනාකම | රු. මි | 48.17 | 51,523.95 |
| ගම්මිරිස් තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.29 | 91.44 |
| | වටිනාකම | රු. මි | 0.86 | 920.80 |
| ඔලියරොසින් | පරිමාව | මෙට්‍රික් ටොන් | 5.92 | 250.29 |
| | වටිනාකම | රු. මි | 64.01 | 2522.18 |
| කරදමුංගු | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.02 | 8.61 |
| | වටිනාකම | රු. මි | 0.48 | 327.83 |
| කරදමුංගු තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 2.96 | 1.33 |
| | වටිනාකම | රු. මි | 6.49 | 144.67 |
| පැඟිරි | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.00 | 2.03 |
| | වටිනාකම | රු. මි | 0.01 | 17.38 |
| සාදික්කා | පරිමාව | මෙට්‍රික් ටොන් | 12.00 | 2257.33 |
| | වටිනාකම | රු. මි | 19.02 | 3761.64 |
| වසාවාසි | පරිමාව | මෙට්‍රික් ටොන් | | 403.65 |
| | වටිනාකම | රු. මි | | 1741.22 |
| වසාවාසි තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.00 | 0.41 |
| | වටිනාකම | රු. මි | 0.02 | 10.43 |
| සාදික්කා තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.01 | 59.98 |
| | වටිනාකම | රු. මි | 0.04 | 885.51 |
| වැනිලා | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.45 | 5.27 |
| | වටිනාකම | රු. මි | 2.63 | 325.44 |
| වැනිලා තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 4.25 | 0.09 |
| | වටිනාකම | රු. මි | 16.08 | 0.39 |
| පුවක් | පරිමාව | මෙට්‍රික් ටොන් | 542.62 | 8851.88 |
| | වටිනාකම | රු. මි | 65.35 | 11598.35 |
| බුලත් | පරිමාව | මෙට්‍රික් ටොන් | | 2313.13 |
| | වටිනාකම | රු. මි | | 2911.14 |
| ඉඟුරු | පරිමාව | මෙට්‍රික් ටොන් | | 58.08 |
| | වටිනාකම | රු. මි | | 166.18 |
| ඉඟුරු තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | 0.10 | 1.69 |
| | වටිනාකම | රු. මි | 3.21 | 70.61 |
| සේර තෙල් | පරිමාව | මෙට්‍රික් ටොන් | | 2.37 |
| | වටිනාකම | රු. මි | | 21.05 |
| කහ | පරිමාව | මෙට්‍රික් ටොන් | | 50.98 |
| | වටිනාකම | රු. මි | | 173.43 |
| ගොරකා | පරිමාව | මෙට්‍රික් ටොන් | 22.42 | 156.81 |
| | වටිනාකම | රු. මි | 11.98 | 267.44 |
| **එකතුව** | **පරිමාව** | **මෙට්‍රික් ටොන්** | **8108.51** | **64,195.16** |
| | **වටිනාකම** | **රු. මි** | **15,275.95** | **157,199.30** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT

# 2024


+ 94 812 388651
helpdesk@dea.gov.lk
www.dea.gov.lk


අතමිට සරු හෙට දිනකට...


අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, ගැටඹේ, පේරාදෙණිය


Cover Designed@ COM DIV | DEA